AL/2024/44/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

ඉස්ලාම් I
இஸ்லாம் I
Islam I

44 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** ඉක්ලාස් යන අරාබි පදයේ අර්ථය කුමක් ද?
(1) රැකීම (2) යටහත්භාවය (3) දේව බිය
(4) පිරිසිදු චේතනාව (5) අසංවේදිතාවය

**2.** ඉස්ලාම් ඉතිහාසයේ සහාබාවරුන්ගේ සමය ආරම්භවන හිජ්රි වර්ෂය කුමක් ද?
(1) හිජ්රි 06 (2) හිජ්රි 08 (3) හිජ්රි 09
(4) හිජ්රි 11 (5) හිජ්රි 15

**3.** අල් කුර්ආන් පහළකිරීමට පෙර එය සටහන් කොට තිබුණේ කුමක ද?
(1) බෛතුල් ඉස්සා (2) ලව්හුල් මහ්ෆූල් (3) බෛතුල් මඃමූර්
(4) සිද්රතුල් මුන්තහා (5) බෛතුල් මුකද්දස්

**4.** හදීස් නිල වශයෙන් එකලස් කිරීමට උත්සාහයන් ආරම්භ කර තිබූ තැනැත්තා,
(1) උස්මාන් (රළි) තුමා ය. (2) අලි (රළි) තුමා ය.
(3) උමර් ඉබ්නු අබ්දුල් අසීස් (රහ්) තුමා ය. (4) අබූ හුරෛරා (රළි) තුමා ය.
(5) ඉමාම් බුහාරි (රහ්) තුමා ය.

**5.** සහීහ් මුස්ලිම් හි ඇතුළත් හදීස් සංඛ්‍යාව
(1) 2 000 කි. (2) 4 000 කි. (3) 4 500 කි.
(4) 200 000 කි. (5) 300 000 කි.

**6.** "ස්ත්‍රියක් කාරණා හතරක් නිසා විවාහ වන්නී ය" යනුවෙන් සඳහන් හදීසයෙහි ඇතුළත් **නොවන** හේතුව කුමක් ද?
(1) සම්පත් (2) පවුල (3) අධ්‍යාපන සුදුසුකම
(4) ආගමික හැඟීම (5) ලස්සන

**7.** 'ෂීආ' යන්නෙහි භාෂාමය අර්ථය කුමක් ද?
(1) වෙන් වී ගිය පිරිස (2) පිට වී ගිය අය (3) සහායක කණ්ඩායම
(4) ප්‍රතිපත්තිධාරීන් (5) විරුද්ධ මත දරන්නන්

**8.** කෙනෙකු සතුව එළුවන් 300 දෙනෙක් සිටියි නම්, ඔහු ගෙවිය යුතු සකාත් ප්‍රමාණය කොපමණ ද?
(1) එළුවන් දෙදෙනෙක් (2) එළුවන් තිදෙනෙක් (3) එළුවන් සිව්දෙනෙක්
(4) එළුවන් පස් දෙනෙක් (5) එළුවන් හය දෙනෙක්

**9.** අස්බාබුන් නුසූල්ව දැන ගැනීමට ඇති මාර්ග දෙකෙන් එකක් වන්නේ,
(1) අස්මාඋර් රිජාල් ය. (2) නාසික්-මන්සූක් ය. (3) මුතෂාබිහාත් ය.
(4) සහීහ්වූ හදීස් ය. (5) මදනි සූරාවන් ය.

**10.** ජාහිලියියා සමයේ කඃබාවට වන්දනාවේ පැමිණෙන වන්දනාකරුවන්ගේ පහසුව සඳහා සකසා තිබූ 'ජල සැපයුම' කුමන නමකින් හැඳින්වූයේ ද?
(1) රිෆාදා (2) සිකායා (3) හිජාබා
(4) ලිවා (5) නද්වා

[ දෙවැනි පිටුව බලන්න.

**11.** ආරම්භක සමයේ සිට ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරු විවිධ වූ දේශපාලනමය දායකත්වයන් සිදුකොට ඇත. එලෙස කුරුණෑගල රාජධානියේ රජු ලෙස කිරුළු පැලැන්ද වූ තැනැත්තා වූයේ,
(1) මඩිගේබැද්ද-ෂේහ් ආලිම් වේ. (2) වත්හිමි-ගලේබණ්ඩාර අවිලියා වේ.
(3) ෂේහ් අබ්දුල් කාදර් වේ. (4) උස්මා ලෙබ්බෙ වේ.
(5) ගෝපාල මුදලිගේ අන්සාර් වේ.

**12.** මුජ්තහිද්වරුන් අතර වඩාත් උසස් තත්ත්වයේ සිටින්නා කවුද?
(1) මුජ්තහිද් මුත්තසිෆ් (2) මුජ්තහිද් බිල් මද්හබ් (3) මුජ්තහිද් බිල් ෆත්වා
(4) මුජ්තහිද් තර්ජීහ් (5) මුජ්තහිද් මුත්ලක්

**13.** හාජිවරු හජ් ඉටුකිරීමට නියමිත දිනයන් වනුයේ,
(1) දුල් හජ් සඳ 1-10 දක්වා ය. (2) දුල් හජ් සඳ 8-13 දක්වා ය.
(3) දුල් හජ් සඳ 13-15 දක්වා ය. (4) දුල් හජ් සඳ 14-17 දක්වා ය.
(5) දුල් හජ් සඳ 18-21 දක්වා ය.

**14.** "රාජාලියා, කපුටා, උකුස්සා වැනි දඩයම් කුරුල්ලන් ජලය බීමෙන් පසු ශේෂවන ජලය පිරිසිදු වේ." යනුවෙන් තීන්දු කළ ඉස්ලාමික නීති මූලාශ්‍රය,
(1) උර්ෆු ආම් ය. (2) ඉජ්මාඋ සුකූති ය. (3) ඉස්තිහ්සාන් ය.
(4) කෞලුස් සහාබි ය. (5) කියාසුල් අද්නා ය.

**15.** ශ්‍රී ලංකාවේ මැණික් ගල් පිළිබඳව සඳහන් කර ඇති 'කිතාබුල් ජමාහිර් ෆී මෑරිෆතිල් ජවාහිර්' යන ග්‍රන්ථයේ කර්තෘ
(1) අල් බලාදුරි වේ. (2) ඉබ්නු බතූතා වේ. (3) යෑකූබි වේ.
(4) අල් බිරූනි වේ. (5) ඉබ්නු ජරීර් වේ.

**16.** ඉස්ලාම් ආර්ථිකයේ විශේෂාංග අතුරෙන් වෙනස් විය හැකි තත්ත්වයේ පවතින නියමයන්වලට ඇතුළත් **නොවනුයේ,**
(1) අල්ලාහ් නියම කළ නීතිවලට අනුව සියලු සම්පත් භාවිත කිරීම ය.
(2) තත්කාලීන ආර්ථික තත්ත්වයන්ට අනුව ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කිරීම ය.
(3) ආර්ථික ආයතන පොදු හිමිකම් සහිත හෝ පෞද්ගලික හිමිකම් සහිත ලෙස හෝ වෙනස් කිරීම ය.
(4) රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල සේවකයන්ගේ වේතන පිළිබඳව තීරණ ගැනීම ය.
(5) ආර්ථික කටයුතුවල රජයේ මැදිහත් වීමේ ප්‍රමාණය තීරණය කිරීම ය.

**17.** පළමුවන අකබා සම්මුතියෙන් පසු නබි (සල්) තුමාගේ තානාපති ලෙස මදීනාවට ගිය සහාබි කවුරුන් ද?
(1) මුස්අබ් ඉබ්නු උමෛර් (රළි) (2) තල්හා ඉබ්නු සුබෛර් (රළි)
(3) සෛද් ඉබ්නු සාබිත් (රළි) (4) අබ්දුල්ලා ඉබ්නු උම්මි මක්තූම් (රළි)
(5) ජෑෆර් ඉබ්නු අබි තාලිබ් (රළි)

**18.** අල් කුර්ආන් මිනිසුන්ට පහළ කිරීමේ අරමුණුවලට ඇතුළත් **නොවන්නේ,**
(1) ජීවිතයට දේව මග පෙන්වීම ලබා ගැනීම ය.
(2) අල්ලාහ්ගේ ප්‍රේමය සහ සමීපතාවය ලබා ගැනීම ය.
(3) එය පරායනය කිරීමෙන් ජීවනාධාරයක් ලබා ගැනීම ය.
(4) බුද්ධිමතුන් එමගින් යහපත් හැඟීම් ලබා ගැනීම ය.
(5) එහි වාක්‍ය ගැන සලකා අධ්‍යයනය කිරීම ය.

**19.** කුලෆාඋර් රාෂිදූන්වරුන්ගේ අවසාන රජවරුන් දෙදෙනාගේ සමයේ රට අභ්‍යන්තරයේ කැරලි බිහිවීමටත් මුස්ලිම්වරුන් අතර බෙදීම් ඇතිවීමටත් හේතු වූ මුනාෆික් වන්නේ,
(1) අබ්දුල්ලා ඉබ්නු උරෛකත් ය. (2) අස්වදුල් අන්සී ය. (3) අබූ ලහබ් ය.
(4) අබ්දුල්ලාහ් ඉබ්නු සබඃ ය. (5) අබූ සුෆ්යාන් ය.

**20.** මකාසිදුෂ් ෂරීආහි 'මකාසිද්' යන පදයේ අර්ථයට ඇතුළත් **නොවනුයේ**
(1) ඉලක්කය වේ. (2) යහගුණය වේ. (3) ළඟාවීම වේ.
(4) අරමුණ වේ. (5) අපේක්ෂිත කාරණය වේ.

**21.** ක්‍රි.ව. 1626 වර්ෂයේ පෘතුගීසි පාලනය යටතේ සියලු ම ප්‍රදේශවල සිට මුස්ලිම්වරු පිටමං කළ අවස්ථාවේ මහනුවර අවට ප්‍රදේශවල සහ මඩකලපුවෙහි ඔවුන්ව පදිංචි කළ රජතුමා කවුද?
(1) දෙවන බුවනෙකබාහු (2) පරාක්‍රමබාහු
(3) පළමුවන රාජසිංහ (4) මානවංශ
(5) සෙනරත්

**22.** පහත ප්‍රකාශ අතුරෙන් ඉස්ලාමික ආර්ථික න්‍යායන්ට **නොගැළපෙන** ප්‍රකාශය කුමක් ද?
(1) තනි පුද්ගල දේපළෙහි සමාජයටත් කොටසක් හිමි ය.
(2) ධනය පිළිබඳව මතුලොවෙහි ද මිනිසා විභාග කරනු ලැබේ.
(3) සම්පත් සියල්ල අල්ලාහ් මිනිසා වෙනුවෙන් මවා ඇත.
(4) ධනය මිනිසාට පරීක්ෂාවකි.
(5) ධනය මිනිසාගේ උත්සාහය නොමැතිව දෙවියන්ගේ දායාදයෙන් පමණක් ලැබේ.

**23.** මධ්‍යම ආසියාවේ ආධ්‍යාත්මික ශක්තිය ලබාදුන් නක්ෂබන්දියා තරීකාවේ නිර්මාතෘවරයා
(1) සෙයෙද් අහ්මද් ෂරීෆ් ය. (2) අබු හාෂිම් ය. (3) ඉබ්නු අරබි ය.
(4) කාදි මුහම්මද් ය. (5) අබු හාමිද් අල් ගස්සාලි ය.

**24.** ඉස්ලාම් නීති විශාරදයින් වෙළෙඳාම සම්බන්ධ වූ නීති රීති සම්පාදනය කර ඇත. ඒ අතුරෙන් 'සලම්' යනු
(1) හවුල් ව්‍යාපාර වේ. (2) උකසට තැබීම වේ.
(3) කුලියට ගැනීම වේ. (4) පෙර ගෙවුම් වෙළෙඳාම වේ.
(5) පසු ගෙවුම් වෙළෙඳාම වේ.

**25.** ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි පාලන සමයේ තමාගේ සංස්කෘතික සලකුණක් වූ තුර්කි තොප්පිය උසාවිය තුළ පැළඳීමට අවසර ඉල්ලා අරගල කළ තැනැත්තා
(1) එම්.සී. සිද්දිලෙබ්බෙ ය. (2) පෙරියතම්බි මරික්කාර් ය.
(3) එම්.සී. අබ්දුල් කාදර් ය. (4) වාප්පිච්චි මරික්කාර් ය.
(5) සර් රාසික් ෆරීද් ය.

**26.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ඉජ්තිහාද් පිළිබඳ **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) ඉජ්තිහාද් යන පදය භාෂාමය පදනමින් සම්පූර්ණ උත්සාහය ගැනීම යන්න අදහස් වේ.
(2) අල් කුර්ආන් නැතහොත් හදීස් නිශ්චිත වශයෙන් අර්ථ දක්වා ඇති ස්ථානවලත් ඉජ්තිහාද් තිබිය හැකි ය.
(3) සියලු ම මද්හබ්වල ඉජ්තිහාද් අනුමත කර ඇති අතර එය භාවිත කර ඇත.
(4) විනිශ්චයන් සිදුනොකළ අලුත් ප්‍රශ්නවලට විනිශ්චයන් ඉදිරිපත් කිරීමට ඉජ්තිහාද් අවශ්‍ය වේ.
(5) ෂරීආහි මූලාශ්‍ර අතර බොහොමයක් විවිධ අදහස්වලට ඉඩ සලසයි. ඒ අතුරෙන් වඩාත් ගැළපෙන අදහසක් තේරීමට ඉජ්තිහාද් අවශ්‍ය වේ.

**27.** නබි (සල්) තුමා තම රාජ්‍ය පරිපාලනයේදී රාජතාන්ත්‍රිකභාවය, සම්මුතීන් හා විදේශ කටයුතු ආදී එකිනෙක ක්ෂේත්‍රයන්ට පත්කර තිබූ සහාබාවරුන්ගේ නම් පිළිවෙළින්,
(1) අලි (රලි), මුආවියා (රලි) සහ උබෛදා (රලි) ය.
(2) උබෛදා (රලි), අලි (රලි) සහ මුආවියා (රලි) ය.
(3) මුආවියා (රලි), උබෛදා (රලි) සහ අලි (රලි) ය.
(4) අලි (රලි), උබෛදා (රලි) සහ මුආවියා (රලි) ය.
(5) උබෛදා (රලි), මුආවියා (රලි) සහ අලි (රලි) ය.

**28.** ඉස්ලාමික බැංකුවල තම ඉලක්ක ළඟා කර ගැනීමේ පදනම්වලට ඇතුළත් **නොවන්නේ**,
(1) ආර්ථික සංවර්ධනයත් සමග සමාජ සංවර්ධනය සම්බන්ධ කිරීම.
(2) පොලිය සම්බන්ධ වන ක්‍රියාවන්ගෙන් සම්පූර්ණයෙන් වැළකීම.
(3) බැංකු කටයුතුවලදී ඉස්ලාම් ෂරිආ නීති ආරක්ෂා කිරීම.
(4) සාම්ප්‍රදායික බැංකු ක්‍රමය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම.
(5) සමාජ ඒකාබද්ධතාවයට හා ආර්ථික අභිවෘද්ධියට දායක වීම.

**29.** ගමනකදී ජලය නොලැබීම නිසා තයම්මුම් සිදුකොට, සලාතය ඉටුකර, පසුව ජලය ලැබුණු විට වුළු සිදුකොට එම සලාතය නැවත ඉටුකළ පුද්ගලයා දෙස බලා නබි (සල්) තුමා,
(1) "ඔබ සුන්නාවට අනුවම ක්‍රියා කළේ ය" යනුවෙන් පැවසූහ.
(2) "ඔබට දෙවතාවක් කුලිය ඇත" යනුවෙන් පැවසූහ.
(3) "ඔබගේ සලාතය ඉටු විය" යනුවෙන් පැවසූහ.
(4) "ආගමික කටයුතුවලදී ඔබ සීමාව ඉක්මවා කටයුතු නොකරනු" යනුවෙන් පැවසූහ.
(5) "ඕනෑම දෙයක දී ඔබ මධ්‍යස්ථව කටයුතු කරන්න" යනුවෙන් පැවසූහ.

**30.** පහත සඳහන් දේ අතුරෙන් හුකූකුල් ඉබාද් සම්බන්ධව **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) ගංවතුර, සුළි සුළං, භූමි කම්පා වැනි ආපදාවලදී සමාජ යහ කටයුතුවල යෙදීම වැදගත් වේ.
(2) මිනිසා තමා වටා තිබෙන්නාවූ භෞතික සම්පත් විධිමත්ව භාවිත කිරීමටත් ආරක්ෂා කිරීමටත් බැඳී සිටියි.
(3) මිනිසා තමාගේ සෞඛ්‍යය ආරක්ෂා කිරීමට නම් රෝගීවන විට ගැළපෙන ප්‍රතිකාර ලබා ගැනීම අනිවාර්ය වේ.
(4) ඥාතීන් සහ අසල්වැසියන් සමග ආදරයෙන් හැසිරීම, අවශ්‍ය අවස්ථාවල උදව් කිරීම, දුක බෙදා ගැනීම යන ප්‍රධාන වගකීම්වල ඇති දේවල් ය.
(5) තම පවුලේ සාමාජිකයන්ගේ යහපත උදෙසා ශරීරය හා හදවතට විවේකය නොදී ඉපයීම ගෘහ මූලිකයාගේ වගකීමක් වේ.

**31.** ෂිආවරුන් අතුරෙන් බිහි වූ 'ඉස්මත්' සංකල්පය පහත සඳහන් දෑ අතුරෙන් කුමක් පෙන්නුම් කරයි ද?
(1) හුසෛන් (රළි) තුමාගේ සොහොනේ තිබී ලබාගත් රෝග සුව කිරීමේ පස
(2) නබිවරුන් ලෙස ම ඉමාම්වරුන්ද, පාපක්‍රියා සහ වැරදි ක්‍රියාවලින් වැළැක්වීමේ තත්ත්වය
(3) මහා පාපයන් සිදුකරන්නකු මුඃමින්වරයකු හා කාෆිර්වරයකු අතරමැදිව සිටියි යන්න
(4) තමා කළ මහා පාපකර්මයන්ට තව්බා නොකර මියගියහොත් ඔහු අඛණ්ඩව අපායෙහි සිටියි යන්න
(5) ඇතැම් කොන්දේසි පදනමින් සිදුකරන තාවකාලික විවාහය

**32.** පහත ප්‍රකාශ සලකන්න.
A - අදහස්වල එකඟතාවය ඇති කටයුතුවලදී අන්‍යෝන්‍ය වශයෙන් සහයෝගය දැක්වීම
B - තීරණවලට මාර්ගය වන්නේ විවාද වේ
C - මතභේදයක් ඇති කාරණාවලදී එකිනෙකාට ඉඩ හැරීම
D - එක් මද්හබයක් හෝ තනි පුද්ගලයෙකුගේ අදහස් පිළිබඳව දැඩි මතයක සිටීම
E - එකිනෙකාට දෝෂාරෝපණය නොකර ගෞරවයෙන් හැසිරීම
F - අන් අය පිළිබඳ යහපත් මතයන් වර්ධනය කර ගැනීම

ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් මතභේදයන්හිදී සුරැකිය යුතු පිළිවෙත් පිළිබඳව ඉස්ලාමික මඟපෙන්වීම පමණක් ඇතුළත් ප්‍රකාශ මොනවා ද?
(1) A, B, C, D (2) A, B, C, E (3) A, C, E, F (4) B, C, D, E (5) B, D, E, F

**33.** පහත දැක්වෙන්නේ මානව හිමිකම් පිළිබඳ ඇතැම් ප්‍රකාශ වේ.
A - 1948 දී එක්සත් ජාතීන්ගේ සංගමය නිකුත් කරන ලද මානව හිමිකම් ප්‍රකාශයට මදීනා ශාසනය තුළින් දෙන ලද මානව හිමිකම් පිළිබඳ කාණ්ඩ ද ඇතුළත් විය.
B - ඉස්ලාම් ලබා දී ඇති මානව හිමිකම්වල ස්වභාවය දිව්‍යමය වේ.
C - අනීතියට එරෙහිව අරගල කිරීම මානව හිමිකම් ලෙස නොසැලකේ.
D - පතිවත රැකීමේ අයිතිය ස්ත්‍රීන්ට පමණක් අයත් අයිතිවාසිකමකි.
E - මිනිසාගේ ගෞරවය ආරක්ෂා කිරීමත් මානව හිමිකම් අතුරෙන් එකකි.

ඉහත ප්‍රකාශ අතුරෙන් ඉස්ලාම් ආගම ලබාදෙන මානව හිමිකම් සම්බන්ධ අදහස් පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) A, B, C (2) A, B, E (3) B, C, D (4) B, C, E (5) C, D, E

**34.** හිජ්රත්වලින් පසුව නබි (සල්) තුමා මුහාජිර්වරුන් සහ අන්සාර්වරුන් අතර ඇති වූ සහෝදරාත්මක පදනමේ අබූබක්ර් (රළි) තුමාගේ සහෝදරයාව සිටි පුද්ගලයා වන්නේ,
(1) අනස් බින් මාලික් (රළි) ය. (2) කාරිජා බින් සෛද් (රළි) ය.
(3) අබූ අයියූබ් අල් අන්සාරි (රළි) ය. (4) සඃද් ඉබ්නු මුආද් (රළි) ය.
(5) අස්අද් බින් සුරාරා (රළි) ය.

**35.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.
A - සෑම ගුණාත්මක දෙයකට ම බාහිර ලක්ෂණ ඇති බව මිනිසාට වැටහීමක් ඇත.
B - අල්ලාහ්ට දාත් සහ සිෆාත් තිබෙන බව අල් කුර්ආන් හි සඳහන් වේ.
C - භෞතික න්‍යායන්ගෙන් ඔබ්බට ගිය අල්ලාහ්ගේ දාත් පිළිබඳව මිනිසාට සංවේදනය කිරීමට හෝ සිතීමට හෝ නොහැකි ය.
D - අල්ලාහ්ගේ දාත් පිළිබඳව සිතීම හැර විශ්වයේ ඔහුගේ මැවුම් පිළිබඳව සිතීමට ඉස්ලාම් මිනිසාව පොළඹවයි.
E - අල්ලාහ් අර්ෂ්හි සිටියි යන්නට අමතර විස්තර සඳහන් කිරීම හා ඒ පිළිබඳ සිතීම ඉස්ලාමික විද්වතුන් අනුමත කර ඇත.

ඉහත ප්‍රකාශවලින් අල්ලාහ්ගේ දාත් පිළිබඳව ඉස්ලාම් සඳහන් කර ඇති නිවැරදි පැහැදිලි කිරීම් ඇතුළත් වරණය තෝරන්න.
(1) A, B, C (2) A, B, D (3) A, B, E (4) B, C, D (5) B, D, E

[ පස්වැනි පිටුව බලන්න.

**36.** පහත සඳහන් ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කරන්න.

A - ඉස්ලාම් තනි මිනිසකුගේ බලපෑම්වලින් තොරව, වහි මාර්ගයෙන් ලබා ගන්නා ලද දැනුම මත පදනම්ව බිහිවූවකි.

B - මිනිස් උත්සාහයෙන් බිහි වූ ආගම් බොහෝවිට ආධ්‍යාත්මික අදහස් අනුගමනය කර ඇත.

C - තනි පුද්ගලයන්ට පමණක් නොව සමස්ත සමාජයට මග පෙන්වන ආගම ඉස්ලාම් දහමයි.

D - භූමිය සෞභාග්‍යවත් කරන කාර්යයෙහි යෙදෙන ලෙස මිනිසාට ඉස්ලාම් අණ කරයි.

E - ඉස්ලාම් සියලු කාලවලට සියලු ප්‍රදේශවලට ගැළපෙන පොදු වූ ධර්මයකි.

ඉහත ප්‍රකාශ අතුරෙන් ඉස්ලාමිහි විශේෂ ලක්ෂණ දැක්වෙන වඩාත් සුදුසු ප්‍රකාශ පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A, B, C (2) A, B, D (3) A, C, E (4) B, C, D (5) B, C, E

**37.** ඉතිහාසයට ඇතුළත් කාලයේ ශ්‍රී ලංකාවට පැමිණ ජනාවාස වූ ප්‍රධාන ජන කණ්ඩායම්,

(1) පෘතුගීසීන්, ලන්දේසීන් සහ ඉංග්‍රීසීන් ය.
(2) ආර්යයන්, රෝමන්වරුන් සහ අරාබිවරුන් ය.
(3) ආර්යයන්, ද්‍රවිඩයන් සහ අරාබිවරුන් ය.
(4) පර්ෂියන්වරුන්, ආර්යයන් සහ ලන්දේසීන් ය.
(5) ග්‍රීකවරුන්, රෝමන්වරුන් සහ පර්ෂියන්වරුන් ය.

**38.** පහත සඳහන් ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කරන්න.

A - වෙළෙඳාමෙහි අවංක වීම

B - පොදු කටයුතු සඳහා දේපළ සම්පූර්ණයෙන් ම වසියත් කිරීම

C - ජාති, ආගම් භේදයෙන් තොරව විශ්වාසයෙන් හා අවංකව කටයුතු කිරීම

D - Zසකාත් ගෙවා, රජයට ගෙවන බදුවලින් වැළකීම

E - අනෙක් අයගේ හිමිකම් ආරක්ෂා කිරීම

ඉහත ප්‍රකාශ අතුරෙන් එදිනෙදා ගනුදෙනුවලදී සුරැකිය යුතු පිළිවෙත් ඇතුළත් වරණය තෝරන්න.

(1) A, B, C (2) A, B, E (3) A, C, E (4) B, D, E (5) C, D, E

**39.** පහත පුද්ගලයින් කෙරෙහි අවධානය යොමු කරන්න.

A - භාර්යාවගේ මව, භාර්යාවගේ සහෝදරිය

B - ලොකු අම්මාගේ දුව, පුංචි අම්මාගේ දුව

C - මව්පස මාමාගේ දුව

D - සහෝදරයාගේ දුව, සහෝදරියගේ දුව

E - ලොකු තාත්තාගේ දුව, බාප්පාගේ දුව

ඉහත කොටස් අතුරෙන් පුරුෂයකුට විවාහවීමට ඉස්ලාමයට අනුව අනුමැතිය ඇති අය ඇතුළත් වරණය තෝරන්න.

(1) A, B, C (2) A, B, E (3) B, C, D (4) B, C, E (5) C, D, E

**40.** පහත වගුවේ A සිට I දක්වා තොරතුරු කෙරෙහි අවධානය යොමු කරන්න.

| | | |
|---|---|---|
| A - අහ්ලුස් සුන්නා | B - මුෂ්රික් | C - ඉමාම් ජඃෆර් සාදික් |
| D - මුල්හිද් | E - සලෆුස් සාලිහීන් | F - ජහමියියා |
| G - නුසෛරි | H - මුඃතසිලා | I - අබ්දුල් කාදිර් ජීලානි |

ඉහත ඇති කොටස් අතුරෙන් ඉස්ලාමීය අකීදාවලට ප්‍රතිවිරුද්ධ පාර්ශ්වයන් පමණක් දැක්වෙන වරණය වන්නේ,

(1) A, B, C, D, E
(2) A, B, D, E, F
(3) B, D, E, F, I
(4) B, D, F, G, H
(5) C, E, F, H, I

**41.** පහත වගුවේ ඇති ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කරන්න.

| | | |
|---|---|---|
| A - අල්ලාහ්ට ආදේශයන් තැබීම | B - අල්ලාහ් නොවන දේ මත දිවිරීම | C - සූර්යයා වැඳීම |
| D - අල්ලාහ් නොවන දෙය කෙරෙහි බිලි දීම | E - හූනියම් කිරීම | F - වශී කිරීම |
| G - නැකැත් බැලීම | H - මැතිරීම | I - මිනිසා දෙවියකු ලෙස පිළිගැනීම |

ඉහත දැ අතුරෙන් ෂිර්කුල් අස්කර් හා සම්බන්ධවන දැ පමණක් ඇතුළත් පිළිතුරු කාණ්ඩය වන්නේ,

(1) A, B, C, D, E, F
(2) A, C, D, E, F, G
(3) B, C, D, E, F, G
(4) B, D, E, F, G, H
(5) B, E, F, G, H, I

● අංක **42** සිට **45** දක්වා වූ සෑම ප්‍රශ්නයකට ම **X** සහ **Y** යන තීරු යටතේ තොරතුරු ලබා දී ඇත. **X** තීරුවේ ඇති තොරතුරු **Y** තීරුවේ ඇති තොරතුරු සමග කිසියම් හෝ ආකාරයකට සම්බන්ධ වේ. එහෙත් ඒවා අපිළිවෙළින් පවතී. ඒ අනුව **X** තීරුවේ පිළිවෙළට **Y** තීරුවේ ඇති තොරතුරු ගැළපෙන පරිදි අනුපිළිවෙළට සැකසීමේ දී නිවැරදිව ලැබෙන පිළිතුර තෝරන්න.

**42.**

| X | Y |
|---|---|
| (i) ෂෆාඅත් | A - සාකච්ඡා කිරීම |
| (ii) වලි | B - සහාබාවරයා |
| (iii) ෂූරා | C - දේව භක්තිකයා |
| (iv) රූහ් | D - නබි (සල්) තුමාගේ මස්ජිදය |
| (v) මස්ජිදුන් නබවි | E - දේහය නොමැති ආත්මය |
| | F - නිර්දේශය |

(1) A, B, C, D, F
(2) B, C, E, D, A
(3) C, E, F, B, D
(4) E, D, A, C, B
(5) F, C, A, E, D

**43.**

| X | Y |
|---|---|
| (i) නුබුව්වත් | A - තෝරාගත් ඇතැම් නබිවරුන්ට අල්ලාහ් විසින් දෙන ලද නබිත්වය |
| (ii) රිසාලත් | B - ඍජුව හෝ වක්‍රව මලාඉකා මාර්ගයෙන් තොරතුරු සන්නිවේදනය කිරීමට තෝරාගත් කෙනෙකුගේ පදවිය |
| (iii) හිදායත් | C - නබි (සල්) තුමා කෙරෙහි ඇති ආදරය හඳුන්වන වචනය |
| (iv) මහබ්බතුර් රසූල් | D - ලෞකික ජීවිතයෙන් පසු ඇතිවන අඛණ්ඩ ජීවිතය |
| (v) මආද් | E - දෙලොවෙහි ම මිනිසා ජයග්‍රහණය කිරීමේ මාර්ගයට මඟ පෙන්වීම |

(1) A, B, C, D, E
(2) A, B, D, E, C
(3) A, B, E, D, C
(4) B, A, E, C, D
(5) B, A, D, C, E

**44.**

| X | Y |
|---|---|
| (i) ඉජ්මාඋ සරීහ් | A - භාණ්ඩ ණයට ගැනීමේදී සාක්ෂි තබා ගැනීම වෙනුවට පොතක සටහන් කොට තබා ගැනීම |
| (ii) කියාසුල් අව්ලා | B - අබු බකර් (රළි) තුමා පාලකයා ලෙස ඒකමතිකව තෝරාගැනීම |
| (iii) ඉස්තිස්හාබ් | C - දෙමව්පියන්ට කසයෙන් ගසා හිංසා කිරීම |
| (iv) මස්ලහා මුර්සලා | D - අල් කුර්ආනය එකලස් කොට ග්‍රන්ථ සංග්‍රහ කිරීම |
| (v) උර්ෆු කාස් | E - මද්‍යසාර විනාකිරි ලෙස වෙනස්වන තෙක් හරාම් වේ |

(1) A, B, C, D, E
(2) A, B, D, E, C
(3) B, C, D, A, E
(4) B, C, E, D, A
(5) C, D, E, B, A

45.

| X | Y |
|---|---|
| (i) ෆස්කු | A - කෙනෙකු තමාගේ භාර්යාව ශාරීරික වශයෙන් තමාගේ මවට උපමා කිරීම |
| (ii) තලාක් | B - කෙනෙකු තම භාර්යාව සමග සංසර්ගයේ නොයෙදේ යැයි දිවුරා කීම |
| (iii) කුල්උ | C - කෙනෙකු තම භාර්යාව වෛශ්‍යාවක් ලෙස වරද පැටවීම |
| (iv) ලිහාර් | D - ස්ත්‍රියක් තම ස්වාමියා සමග සම්බන්ධ වී ජීවත්වීමට නොහැකි අවස්ථාවකදී විවාහ බන්ධනයෙන් තමාව නිදහස් කර ගැනීම |
| (v) ඊලාඋ | E - විවාහ ගිවිසුමේ දෝෂයක් හට ගැනීම |
| | F - පිරිමියා තම භාර්යාව දික්කසාද කිරීම |

(1) A, B, C, D, E (2) B, C, D, E, A (3) C, D, E, A, B
(4) D, E, A, B, C (5) E, F, D, A, B

- අංක **46** සිට **50** දක්වා ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලය සම්බන්ධයෙන් පහත සඳහන් (1), (2), (3), (4), (5) යන වරණවලින් වඩාත් ගැළපෙන යුගලය සහිත වරණය තෝරා එහි අංකය පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

| අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | වැරදි ය. | නිවැරදි ය. |
| (3) | නිවැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | වැරදි ය. |
| (5) | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමුවන ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **46.** | නබි (සල්) තුමාගේ විවාහයෙන් පසු 'මුත්' දෙකක ප්‍රමාණයේ වලීමා භෝජන සංග්‍රහයක් දුන්හ. | විවාහ භෝජන සංග්‍රහයකට (වලීමා) ආරාධනා කළහොත් එයට පිළිතුරු සැපයීම අනිවාර්ය නොවේ. |
| **47.** | බඩගින්න හේතුවෙන් සොරකම් කළත් සොරකම් කිරීම සිදුකළ පුද්ගලයාට දඬුවම් ලබා දේ. | අපරාධ සිදුවීම වැළැක්වීමට පරිසරය සැකසීමෙන් අනතුරුව අපරාධවලට අදාළ ඉස්ලාමික දණ්ඩනය ක්‍රියාත්මක කෙරේ. |
| **48.** | යහපත කියා දී, අයහපත වැළැක්වීමේ ක්‍රියාවෙහි යෙදෙන්නන්ට එම ක්‍රියාවේ පිළිවෙළ, නීති රීති ආදිය ගැන වැටහීමක් හා ඒ පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතු ය. | ෆික්හු දඃවා යනු දේව මගපෙන්වීම වටහා නොගත් සමාජය අතරත් පහත් ක්‍රියාවලින් යුතු මුස්ලිම් සමාජය අතරත් ආරාධනා කරන ක්‍රමය වේ. මෙලෙස එය සිදු කරන පිළිවෙළ මුස්ලිම්වරයෙකුට ඉගැන්වීමේ කලාවක් ද වේ. |
| **49.** | ඉස්ලාම් සමාජ ව්‍යුහය අල්ලාහ්ගේ සහ ඔහුගේ දූතයාගේ මගපෙන්වීමෙන් ගොඩ නඟා තිබීම එහි ඇති විශේෂත්වයයි. | රැකියා ලබාදීම, සම අවස්ථා ලබාදීම හා දුප්පතුන්ට පහසුකම් සැලසීම වැනි කටයුතුවලදී ඉස්ලාම් නීතිය අවධාරණය කරයි. |
| **50.** | ක්‍රි.ව. 9 සහ 10 වන සියවස්වලදී ශ්‍රී ලංකාවේ වෙරළබඩ තීරයන්හි මුස්ලිම් ජනාවාස පිළිබඳව සාක්ෂි කිසිවක් තහවුරු කර නොමැත. | ක්‍රි.ව. 13 වන සියවසේ පවා මුස්ලිම්වරු ශ්‍රී ලංකාවේ දේශපාලන බලපෑම් සිදුකරන මට්ටමට වර්ධනය නොවී ය. |

***

0716

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024**
**General Certificate of Education (Adv. Level) Examination, 2024**

| | |
|---|---|
| **ඉස්ලාම් II**<br>இஸ்லாம் II<br>Islam II | **44 S II** |

| | |
|---|---|
| ***පැය තුනයි***<br>*மூன்று மணித்தியாலம்*<br>*Three hours* | **අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**<br>மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்<br>Additional Reading Time - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

※ **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) 'තෞබා' යනු කුමක් ද? (ලකුණු 02යි)

(ii) 'තෞබා' කරන විට අනුගමනය කළ යුතු කොන්දේසි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iii) ඊමාන්, අමල්, අක්ලාක් ආදිය අතර පවතින සබඳතා පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

(iv) අධ්‍යාත්මික සංවර්ධනය සඳහා බාධාවන අංශ **හතරක්** සඳහන් කොට විස්තර කරන්න. (ලකුණු 08යි)

**2.** (i) මෞලූඋ හදීස් අර්ථ දක්වන්න. (ලකුණු 02යි)

(ii) මක්බූල්වූ හදීස් සහ මර්දූද්වූ හදීස් වෙන්කර දක්වන්න. (ලකුණු 04යි)

(iii) මෞලූඋ හදීස් බිහිවීමට හේතු වූ කරුණු **තුනක්** නිදසුන් සහිතව විවරණය කරන්න. (ලකුණු 06යි)

(iv) ඉජ්මාඋ නීති මූලාශ්‍රයක් යන්න අල්කුර්ආන් සහ සුන්නා සාක්ෂි සහිතව ඔප්පු කරන්න. (ලකුණු 08යි)

**3.** (i) ආහාර ගැනීම පිළිබඳ ඉස්ලාම්හි අරමුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

(ii) ඇඳුම් ඇඳීම පිළිබඳ ඉස්ලාම්හි අරමුණු ලියා, එයට අදාළ හදීස් මූලාශ්‍රයක් සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iii) ආහාර ලෙස ගැනීම තහනම් කරන ලද මාංශ පිළිබඳ ඉස්ලාමීය මග පෙන්වීම් ලියා දක්වන්න. (ලකුණු 06යි)

(iv) ඉස්ලාම් දෘෂ්ටිකෝණයෙන් විවාහයෙහි අරමුණු **හතරක්** සඳහන් කොට විස්තර කරන්න. (ලකුණු 08යි)

[ දෙවැනි පිටුව බලන්න.

## II කොටස

**4.** (i) සමාජ අභිවෘද්ධියට මස්ජිද් ඉටු කළ යුතු කාර්යභාරය හඳුන්වාදී විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) මතුලොව ජීවිතය අවශ්‍යය යන්නට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

**5.** (i) කියන ආකාරය සහ අවස්ථාව පදනම්කරගෙන වර්ගකරනු ලබන තලාක් **දෙවර්ගය** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) ඉස්ලාම්හි පෙන්වා දී ඇති පරිදි ළමයින් දෙමව්පියන්ට ඉටුකළ යුතු වගකීම් විස්තර කරන්න. (ලකුණු 10යි)

**6.** (i) ඉස්ලාම් නීති සම්පාදන ඉතිහාසයේ 'ඉජ්තිහාද්හි දොර වසා දමන ලදී' යන චින්තනයෙන් ඇති වූ ප්‍රතිවිපාක පරීක්ෂා කරන්න. (ලකුණු 10යි)

(ii) අල්කුර්ආන්හි භාෂාමය වශයෙන් හා විද්‍යාත්මක වශයෙන් ඇති ආශ්චර්යයන් ගැඹුරින් පරීක්ෂා කරන්න. (ලකුණු 10යි)

**7.** (i) අපරාධවලට විරුද්ධව ඉස්ලාම් පනවා ඇති දඬුවම්වල යුක්තිසහගත භාවය ඉදිරිපත් කරන්න. (ලකුණු 10යි)

(ii) මත්ද්‍රව්‍ය භාවිතය නිසා ඇතිවන සමාජ-ආර්ථික බලපෑම් සඳහන් කොට තරුණයින් අතර මත්ද්‍රව්‍ය භාවිතය නැවැත්වීමට ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න. (ලකුණු 10යි)

**8.** පහත සඳහන් මාතෘකා ගැන කෙටි සටහන් ලියන්න.

(i) අල්කුර්ආන් කොටසින් කොටස පහළ කිරීමට හේතු (ලකුණු 05යි)

(ii) ඉස්ලාම්හි කර්මාන්තවල වැදගත්කම (ලකුණු 05යි)

(iii) ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වාදීම (ලකුණු 05යි)

(iv) හජ්හි ලෞකික ප්‍රයෝජන (ලකුණු 05යි)

***

සියලු ම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2024

# 44 - ඉස්ලාම්

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2024

## 44 - ඉස්ලාම්

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

**I - පත්‍රය** - **කාලය : පැය 02 යි**

වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්ණ 50 කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුයි. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 50 කි.

**II - පත්‍රය** - **කාලය : පැය 03 යි**

මෙම ප්‍රශ්න පත්‍රය I හා II වශයෙන් කොටස් දෙකකින් යුක්තය.

I කොටස - ව්‍යුහගත ප්‍රශ්න 03 කින් ප්‍රශ්න 02 කට පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40 කි.

II කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න 05 කි. ප්‍රශ්න 03 කට පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 60 කි.

අවසාන ලකුණු ගණනය කිරීම : I පත්‍රය = 50
II පත්‍රය = 100

**අවසාන ලකුණු :** $50 + \left(\frac{100}{2}\right) = \underline{\underline{100}}$

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ............................................................ ............................................................ ............................................................ √ △ $\frac{4}{5}$

(ii) ............................................................ ............................................................ ............................................................ √ △ $\frac{3}{5}$

(iii) ............................................................ ............................................................ ............................................................ √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

මෙවර සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2024

විෂය අංකය / பாட இலக்கம்: 44

විෂයය / பாடம்: ඉස්ලාම්

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 2 | 21. | 5 | 31. | 2 | 41. | 4 |
| 02. | 4 | 12. | 5 | 22. | 5 | 32. | 3 | 42. | 5 |
| 03. | 2 | 13. | 2 | 23. | 4 | 33. | 2 | 43. | 4 |
| 04. | 3 | 14. | 3 | 24. | 4 | 34. | 2 | 44. | 4 |
| 05. | 2 | 15. | 4 | 25. | 3 | 35. | 4 | 45. | 5 |
| 06. | 3 | 16. | 1 | 26. | 2 | 36. | 3 | 46. | 3 |
| 07. | 3 | 17. | 1 | 27. | 2 | 37. | 3 | 47. | 2 |
| 08. | 2 | 18. | 3 | 28. | 4 | 38. | 3 | 48. | 5 |
| 09. | 4 | 19. | 4 | 29. | 2 | 39. | 4 | 49. | 1 |
| 10. | 2 | 20. | 2 | 30. | 5 | 40. | 4 | 50. | 4 |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்
මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 50 = 50

## II පත්‍රය - I කොටස

### ප්‍රශ්න අංක 01

1. (i) 'තෞබා' යනු කුමක් ද? (ලකුණු 02යි)

- 'තව්බා' යන පදයේ ආපසු හැරීම, මිදීම යන අර්ථය ගෙන දෙයි.
- ඉස්ලාමීය ව්‍යවහාරයේ 'පාපක්ෂමාව' හැඟවීමට මෙම පදය භාවිතා කරයි. එනම්, ගැත්තෙකු මෙ වන තුරු ජීවත් වූ වැරදි ක්‍රමයෙන් මිදී නිවැරදි ක්‍රමය වෙත හැරීම වේ.
- **පාපයන් නිසා දෙවිඳුන්ගෙන් ඈත්වෙමින් යන මිනිසා ඔහු වෙත නැවත ආපසු ළඟා වීම 'තව්බා' යැයි හඟවනු ලබයි.**

***(ඉස්ලාමීය ව්‍යවහාරය සඳහන් කර ඇත්නම් ලකුණු 02 ද භාෂාමය අර්ථය පමණක් සඳහන් කර ඇත්නම් ලකුණු 01 ක් ලබා දෙන්න.)***

(ii) 'තෞබා' කරන විට අනුගමනය කළ යුතු කොන්දේසි හතරක් සඳහන් කරන්න. (ලකුණු 04යි)

- පිවිතුරු චේතනාවකින් (ඉඛ්ලාස්) පාපක්ෂමාව අයදීම
- අදාළ පාපයන්හි නිරත වීම අත හැරිය යුතු ය.
- තමා විසින් කරනු ලැබූ වැරද්ද ගැන සිතා පසුතැවිය යුතුය.
- අදාළ පාපයෙහි මින් පසු ව නො නියැළෙන බව අධිෂ්ඨාන කරගත යුතු ය.
- පුද්ගලයෙකු හා සම්බන්ධ වැරද්දක් වුවහොත් ඔහුගෙන් සමාව ලබා ගැනීම.

***(ඉහත සඳහන් කරුණු අතරින් කරුණු හතරක් විස්තර කර ඇත්නම් ලකුණු 1×4=04 ක් ලබා දෙන්න.)***

(iii) ඊමාන්, අමල්, අක්ලාක් ආදිය අතර පවතින සබඳතා පැහැදිලි කරන්න. (ලකුණු 06යි)

- ඊමාන් යන්න ඉබාදත්, මුආමලාත්, අඛ්ලාක් යනාදිය පරස්පර සම්බන්ධතාවයක් ඇත.
- ඉබාදත්, මුආමලාත්, අඛ්ලාක් යනාදිය ඊමානයට බලපෑමක් ඇති කරන සේ ඒවා සියල්ල ඊමානය සමග ඒකාබද්ධව පවතී.
- ඊමානයේ ගුණාත්මකත්වයට අනුව අමල්හි ගුණාත්මකභාවය රුදී පවතී. එම ගුණාත්මකභාවයට සරිලන පරිදි අල්ලාහ් කුසල් ප්‍රධානය කරනු ඇත. ඊමාන් නොමැති අමල් මිරිඟුවක් වැනිය.
- ඊමාන් සමග මිශ්‍ර වූ ඉබාදත්, අඛ්ලාක් යනාදිය අතර සම්බන්ධය චක්‍රකාරය. එනම්, ඊමාන් මිශ්‍ර වූ ඉබාදත් තුළින් ශ්‍රේෂ්ඨ වූ අඛ්ලාක් ගොඩ නගමින් අන්‍ය ජනතාව අතර සබැඳියාව යහපත් කරයි.
- ඊමාන්, අමල්, අඛ්ලාක් යනාදිය අතර ඉස්ලාම් ඇති කළ සම්බන්ධය පැහැදිලි කිරීමට පහත දැක්වෙන උදාහරණය ඉතාම සුදුසුය. ඊමාන් ප්‍රාණය වැනිය. අමල් ශරීරය වැනිය. අඛ්ලාක් ශරීරය ආවරණය කරන, අලංකාර කරන ඇඳුම් පැළඳුම් වැනිය.
- ඊමාන් මගින් එළිදක්වන අමල්, 'අඛ්ලාක්' නම් ඇඳුම් පැළඳුම්වලින් අලංකාර වන මුස්ලිම්වරයෙක් විය යුතුය. ඔහුගේ මෙලොව, පරලොව ජයග්‍රහණයේ මාර්ගය මෙයම වේ.

***(මෙවැනි කරුණු තුනක් අංශ තුන සමගම සම්බන්ධ කර පැහැදිලි කර ඇත්නම් ලකුණු 3×2=06 ක් ලබා දෙන්න.)***

(iv) අධ්‍යාත්මික සංවර්ධනය සඳහා බාධාවන අංශ **හතරක්** සඳහන් කොට විස්තර කරන්න. (ලකුණු 08යි)

අහංකාරය, ඊර්ෂ්‍යාව, **තෘෂ්ණාව, මුසාව, කේළම,** අපවාදය, අවලාද යනාදිය ආධ්‍යාත්මික සංවර්ධනයට බාධා ඇති කරන කාරණා වේ.

<u>අහංකාරය</u>

- 'රහ්මාන්ගේ ගැත්තන් පොළොවෙහි යටහත්ව ඇවිදියි' (අල්කුර්ආන් 25:63)
- අහංකාරය, ගෞරවය යනාදිය මාගේ වස්ත්‍ර වේ. කවරෙකු මින් එකක් හෝ ගන්නේ නම් ඔහුව නිරයට ඇතුල් කරන්නෙමි. (මුස්ලිම්)
- **"ගෞරවය මාගේ වස්ත්‍රය වේ. ආත්මාඩම්භරය මා සතු පොරවණයකි. එම නිසා කවරෙකු මේ කෙරෙහි මාත් සමඟ විරුද්ධ වන්නේද ඔහුට දඬුවම් කරන්නෙමි." (මුස්ලිම්)**
- **"එම පරලොව වාසස්ථානය මහ පොළොවෙහි උද්ධාමය හෝ අනර්ථකම් අපේක්ෂා නොකරන අයට අපි එය නියම කරන්නෙමු. අවසාන (විමුක්ති) ය බිය බැතිමතුන් හටය." (අල්කසස්: 83)**
- **"කවරෙකුගේ සිතෙහි අල්ප මාත්‍රයක් හෝ ආඩම්බරය තිබෙන්නේ ද ඔහු ස්වර්ගයට නොපිවිසෙන්නේ යැයි නබි (සල්) තුමාණෝ පැවසූ විට පුද්ගලයෙකු නැගිට, තම ඇඳුම අලංකාරව තිබිය යුතුයි; තම පාවහන් අලංකාරව තිබිය යුතුයි යැයි ප්‍රිය කරන්නේ නම්, එය ආඩම්භරයද? යැයි විමසුවේය. එයට නබි (සල්) තුමාණෝ 'අල්ලාහ් අලංකාරය. අලංකාරත්වය ඔහු ප්‍රිය කරන්නේය. ආඩම්භරය යනු සත්‍යය ප්‍රතික්ෂේප කිරීම හා මිනිසුන්ව අවතක්සේරු කිරීම' යැයි පිළිතුරු දුන්හ." (මුස්ලිම්)**

<u>ඊර්ෂ්‍යාව</u>

- "ගින්න දර පුළුස්සා දමන සේ ඊර්ෂ්‍යාව නුඹලාගේ කුසලයන් පුළුස්සා දමයි." (අබූදාවූද්)
- ආගම්ලැබූවන් නබිතුමාට විරුද්ධවූයේ ඊර්ෂ්‍යාව හේතුවෙනි. (අල්කුර්ආන් 2:119)
- **"ඊර්ෂ්‍යාකරන්නා, ඊර්ෂ්‍යා කරන විට ඇතිවන අහිතකර බලපෑමෙන් ද අරුණෝදයේ පරමාධිපතිගෙන් මම ආරක්ෂාව පතන්නෙමි." (අල්ෆලක් :5)**

<u>මුසාව</u>

- තම දෙඇස් නොබැලූ දෙයක් දෙඇස්වලට පෙන්වීම සියල්ලට වඩා විශාලම මුසාව වේ. (බුඛාරි)
- සත්‍ය තෘප්තිය ගෙන දෙයි. එය ව්‍යාජ සැකයන්වලට හා පෙළඹවීම්වලට තුඩු දෙයි. (තිර්මිදි)
- **"නබි (සල්) තුමාණන්ගෙන් 'මුඃමින්වරයෙකු බියගුල්ලෙකු සිටියිද?' යැයි විමසනු ලැබූ විට එතුමාණෝ 'ඔව්' යැයි පිළිතුරු දුන්හ. 'මුඃමින්වරයෙකු ලෝභයෙකු ලෙස සිටියිද?' යැයි විමසනු ලැබූ විට 'ඔව්' යැයි පිළිතුරු දුන්හ. 'මුඃමින්වරයෙකු මුසාවාදියෙකු ලෙස සිටියිද?' යැයි විමසනු ලැබූ විට 'නැත' යැයි පිළිතුරු දුන්හ." (මාලික්)**
- **"අස්මා (රළි) තුමිය, අල්ලාහ්ගේ දූතයාණනි. අපගෙන් කෙනෙක් තමා ප්‍රිය කරන යමක් තමා ප්‍රිය නො කරන බව පැවසුව හොත් එය මුසාවක් වන්නේද? යි විමසුවාය එවිට නබි (සල්) තුමාණෝ එය මුසාවකි. මුසාවක් යනුවෙන් සටහන් කරනු ලබයි සුළු වශයෙන් මුසාවක් පැවසුව ද සුළු මුසාවක් ලෙස සටහන් කරගනු ලබයි." (මුස්ලිම්)**
- **"ගැත්තෙකු තමා සත්‍යවාදියෙකු ලෙස සිටිය ද විහිළුවට හා විවාද කරන විට බොරුව අතහරින තෙක් පූර්ණ මුස්ලිම්වරයෙකු නොවන්නේය." (අහ්මද්)**

ඕපදූප කතා කිරීම

- (කිසිවෙකුගේ වැරැද්දක්) පිළිබඳ ව නුඹලා හාරඅවුස්සමින් විමසන්න එපා. නුඹලාගෙන් කෙනෙකු අනෙකා පිළිබඳ ඕපදූප කතා නොකරන්න. නුඹලාගෙන් කිසිවෙක් මියගිය තම සහෝදරියගේ මාංශ අනුභව කරයිද? එය නුඹලා පිළිකුල් කරයි. (ඕපදූප කතා කිරීම ද එසේමය) අල්ලාහ්ට බිය වන්න. (අල්කුර්ආන් 49:12)
- වරක් ආයිෂා (රළි) තුමිය, 'සෆියියා (රළි) තුමිය මිටිවීම පිළිබඳ ව කතා කළ බව ඇසූ විට, නබි (සල්) තුමාණෝ අයිෂා (රළි) තුමිය දෙස බලා, මෙසේ පැවසූහ. "ඔබ පැවසූ වචනය මුහුදු ජලයේ මිශ්‍ර වුවහොත් එය පවා විනාශ වනු ඇත. (අබූ දාවූද්)

කේළම්

- නබිවරයාණෙනි! (සැමවිටම) දිවුරන කිසිවකුට නුඹ අනුගමනය නොකරන්න. ඔහු සදා ඕපදූප කතා කරමින්, කේළම් කීම ඔහුගේ රැකියාව කරගත්තෙක් වේ. (අල්කුර්ආන් 68:10)
- කේළම් කියමින් සැරිසරන්නන් ස්වර්ගයට ඇතුළු නොවේ. (බුහාරි)
- **"නබි (සල්) තුමාණෝ කබූර් දෙකක් පසුකර යන විට, 'මොවුන් දෙදෙනා වේදනා දෙනු ලබති' යැයි පැවසූහ. ඔවුන්ට වේදනා දෙනු ලබන්නේ බරපතල දෙයකට නොවේ. නමුත්, එය බරපතල දෙයකි. මොවුන්ගෙන් කෙනෙකු කේලම් පවසමින් සිටි අයෙකි. අනෙකා මුත්‍රා කිරීමෙන් අනතුරුව පිරිසිදු නොකරන කෙනෙක්ව සිටියෝය." (බුහාරි)**
- **"නුඹලාගෙන් අයහපත් පුද්ගලයාව මම පවසන්නද? යැයි නබි (සල්) තුමාණෝ සහාබිවරුන්ගෙන් විමසූ විට ඔවුන් 'ඔව්' යනුවෙන් පිළිතුරු දුන්හ. එවිට, නබි (සල්) තුමාණෝ 'කේලම් පවසන්නා, මිතුරන්ව වෙන් කරන්නා හා නිදොස් පුද්ගලයගේ අඩුපාඩු සොයන්නා' යනුවෙන් පිළිතුරු දුන්හ." (අහ්මද්)**

අපවාදය

- **"යමෙක් නිර්මල ස්ත්‍රීන්ට අපවාද නගන්නේ ද (එයට අවශ්‍ය) සාක්ෂිකරුවන් හතර දෙනෙකු නොගෙනෙන්නේ නම්, නුඹලා ඔහුට කස පහර අසූවක් පහර දිය යුතුය. පසුව එවැන්නන් පවසන සාක්ෂි කිසිදිනක භාර නොගන්න. නියතවශයෙන්ම, ඔවුන් (සීමාව ඉක්මවා ගිය) අයහපත් පුද්ගලයන්ය." (අල්කුර්ආන් 24:19)**

තෘෂ්ණාව

- "තෘෂ්ණාව මිනිස් සිතෙහි වර්ධනය වන විට පරිත්‍යාගශීලි ගුණය තුරන් වී මසුරුකම ඇති වේ." (අල්කුර්ආන් 102:1-2) (අල්කුර්ආන් 3:14)
- "ලෞකික ආශාවන් සොයා කැදවන්නන් අතහැර දමන්න. කවරෙකු ලෞකික ආශාවන් තම අවශ්‍යතාවයට වඩා ලබා ගන්නේ ද ඔහු විනාශය සොයා ගන්නේය. (බස්සාර්)
- **"මිනිසාට රත්තරන් පිරුණු ආකාරයක් තිබුණ ද මා හට තවත් ආකාරයක් මෙලෙසම තිබුණේ නම්, යැයි ඔහු ප්‍රිය කරයි. ඔහුගේ කට පස්වලින් පුරවයි." (බුහාරි)**

***(කරුණු හතරක් සඳහන් කර පැහැදිලි කර ඇත්නම් ලකුණු 4×2=08 ක් ලබා දෙන්න.)***

## ප්‍රශ්න අංක 02

**2.** (i) මෞලූඋවූ හදීස් අර්ථ දක්වන්න. (ලකුණු 02යි)

- නබි (සල්) තුමාණන් නොපැවසූ, නොකළ, ප්‍රතික්ෂේප කළ, එතුමන්ගේ ගුණාංගවල, වර්ණනාවල අඩංගු නොවන දේවල් පැවසූ බවටත්, කළ බවටත්, පිළිගත් බවත්, ගුණාංග, වර්ණනාවල අඩංගු වන බවත් අසත්‍ය ලෙස සඳහන් කිරීම 'ව්‍යාජ හදීස්' හෙවත් 'මෞලූඃ' යනුවෙන් සඳහන් කෙරෙයි.

*(පැහැදිලි කර ඇත්නම් ලකුණු **02**ක් ලබා දෙන්න.)*

(ii) මක්බූල්වූ හදීස් සහ මර්දූද්වූ හදීස් වෙන්කර දක්වන්න. (ලකුණු 04යි)

**මක්බූල් වූ හදීස්**

- මක්බූල් වූ හදීස් යනු හදීස් දැනුම් දෙන්නාගේ විශ්වාසවනත්භාවය හා දැනුම් දෙන ලද පුවතෙහි විශ්වාසවනත්භාවය ශක්තිමත් ව තිබෙන හදීස් වර්ගය වේ.
- මෙවැනි හදීස් සාධක සහිතවූත්, පිළිගත හැකිවූත්, පිළිගෙන අමල් කිරීමට හැකිවූත් ධර්මයේ ද ෂරීආවේ ද සැම අංශයක දම අන් අයට අණ කළ හැකිවූත් හදීස් වේ.

**මර්දූද් හදීස්**

- මර්දූද් හදීස් යනු හදීස් දැනුම් දෙන්නාගේ විශ්වාසවනත්භාවය හා දැනුම් දෙන ලද පුවතෙහි විශ්වාසවනත්භාවය ශක්තිමත් නොවූ හදීස් වර්ගය වේ.
- මෙවැනි හදීස් සාධක ලෙස පිළිගැනීමට හෝ ඒවා පදනම් කොට ගෙන අමල් කිරීමට හෝ ක්‍රියාකරන්නට හෝ ඒවා මගින් අන් අයට අණ කිරීමට හෝ නොහැකිවූ හදීස් වේ.
- නමුත්, මෙවන් හදීස්වල වර්ග කිහිපයක් කොන්දේසි සහිතව පිළිගත හැකි බව හදීස් ක්ෂේත්‍රයේ විශේෂඥයෝ සඳහන් කරති.

*(මේ දෙඅංශයේම වෙනස්කම් පැහැදිලිව සඳහන් කර ඇත්නම් ලකුණු **2×2=04** ක් ලබා දෙන්න.)*

(iii) මෞලූඋවූ හදීස් බිහිවීමට හේතු වූ කරුණු තුනක් නිදසුන් සහිතව විවරණය කරන්න. (ලකුණු 06යි)

- දේශපාලනික හේතු
  - 'ගින්දර, දර පුළුස්සා දමනා සේ අලි (රලි) තුමාට සෙනෙහස දැක්වීම අකුසල් පුළුස්සා දමයි.' (ව්‍යාජ හදීස්)
  - 'අල්ලාහ්ගේ විශ්වාසවන්තයින් තිදෙනෙකි. මම, ජිබ්රීල්, මුආවියා වේ.' (ව්‍යාජ හදීස්)

- සින්දීක්වරුන් හෙවත් ඉස්ලාමයේ විරුද්ධවාදීන්ගේ ක්‍රියාකලාපය
  - 'අල්ලාහ් තම පපුවේ හා දෑතේ රෝමවලින් මලක්වරුන්ව මැව්වේ.' (ව්‍යාජ හදීස්)
  - ලස්සන මුහුණක් බැලීම ඉබාදත් වේ.' (ව්‍යාජ හදීස්)

- භාෂාව, ජාතිය, ප්‍රදේශ, මද්හබ්, ඉමාම් යනාදී කරුණුවල අන්තවාදීන් ගෙතූ ව්‍යාජ හදීස්
  - 'අල්ලාහ්ගේ අර්ෂය දරා සිටින්නෝ පර්සියානු බස කතා කරති. අල්ලාහ් වහී පහළ කරන විට සියුම් කරුණු පර්සියානු භාෂාවෙන් ද රළු කරුණු අරාබි භාෂාවෙන් ද පහළ කළේය.' (ව්‍යාජ හදීස්)

- 'ස්වර්ගයේ බස, අරාබි බස වේ. අල්ලාහ්ට ඉතා පිළිකුල් වූ බස පර්සියානු බස වේ.' (ව්‍යාජ හදීස්)
- 'මක්කා, මදීනා, බයිතුල් මුකද්දස්, දිමිෂ් (ඩමස්කස්) යනාදී නගර සතර මෙලොවේ ස්වර්ග නගර වේ. (ව්‍යාජ හදීස්)
- 'මාගේ උම්මතයෙහි අබූ හනීෆා ඉබ්නු නුඃමාන් නම් කෙනෙකු බිහි වෙයි. ඔහු සමාජයේ පහන් ටැඹක් වේ.' (ව්‍යාජ හදීස්)
- 'මුහම්මද් බින් ඉද්රීස් නම් කෙනෙකු පසු කාලීන ව මාගේ සමාජයේ බිහිවනු ඇත. ඔහු ඉබ්ලීස්ටත් වඩා කාලකන්නියෙක් ලෙස සිටිනු ඇත.' (ව්‍යාජ හදීස්)

- උපදේශකයින් හා කතාන්දර කියන්නන් ගෙතූ ව්‍යාජ හදීස්
  උපදේශකයින් හා කතාන්දර කියන්නන් ගෙතූ ව්‍යාජ හදීස්
  - 'කවරෙකු ලා ඉලාහ් ඉල්ලල්ලාහ් යැයි පවසන්නේ ද එහි සෑම වචනයකටම එක් පක්ෂියෙක් මවනු ලැබෙයි. උගේ හොට රත්තරන්වලින් ද, පිහාටු නවරත්නයෙන් ද මවා ඇත.' (ව්‍යාජ හදීස්)
  - 'නූහ් නබිතුමාගේ නැව තුෆාන් ගංවතුරේ පාවී ගොස් කඃබාව හත් වතාවක් තවාෆ් කර එක් වතාවක් සුජූද් කළේය.' (ව්‍යාජ හදීස්)

- පික්හු කලාවේ හා ඉල්මුල් කලාමයේ මතභේද ඇති උදවිය ගෙතූ ව්‍යාජ හදීස්
  - 'යමෙක් යාච්ඤාවේ දී තම දෙඅත් ඔසවන්නේද, ඔහුගේ යාච්ඤාව බිද වැටේ. (ව්‍යාජ හදීස් )
  - 'කවුරුන් අල්කුර්ආනය මැවූ එකක් බව පවසන්නේ ද ඔහු කාෆිර්වරයෙකු වනු ඇත.' (ව්‍යාජ හදීස් )

- ආගමේ නොදැනනුවත්කම හා එය ක්‍රියා කළ යුතු යැයි ආසාව ඇති උදවිය ගෙතූ ව්‍යාජ හදීස්
  - 'අපි රසූල්ලාහ් වෙනුවෙන් ගෙතුවෙමු.' යැයි සාදාරණය කළේය.
  - ගුලාම් කලීල් නම් තැනත්තා දික්රයේ විශේෂත්වය ගැන ව්‍යාජ හදිස් දැනුම් දුන්නේය. ජනතාවගේ හදවත් වශීකර කුසල් කෙරෙහි ඔවුන්ව උනන්දු කරවීමට මෙසේ කළ බව ඔහු පැවසීය.

- පාලකවරුන්ගේ ද ධනවතුන්ගේ ද සේවය ලබා ගැනීම උදෙසා ගෙතූ ව්‍යාජ හදීස්
  පාලකවරුන්ගේ ද ධනවතුන්ගේ ද සේවය ලබා ගැනීම උදෙසා ගෙතූ ව්‍යාජ හදීසය.
  - අබ්බාසිය කලීෆා මහ්දිගෙන් ඉයාස් ඉබ්නු ඉබ්රාහීම් පැවසූ ව්‍යාජ හදීසය. කලීෆා තුමා 'ඔහු කලීෆාගෙන් යමක් ලබා ගැනීම පිණිස රජමාලිගාවට පැමිණියේය. කලීෆා තුමා පරවියන් සමග සෙල්ලම් කරමින් සිටිනු දුටු ඔහු, මොහුගේ මෙම ක්‍රීඩාව ඉස්ලාමය අනුමත කළ එකක් බව තහවුරු කිරීමට සත්‍ය හදීසය වන "ඊතල, අශ්වයින්, ඔටුවන් හැර වෙන කිසිවක් තරගයට මුදා හැරීම තහනම්." (අල් හදීස්) යන හදීසයට 'පක්ෂීන්' යන වචනය ද එක් කර දනුම් දුන්නේය. මොහු අසත්‍යයක් පැවසූ බව කලීෆාවරයා වටහා ගත් නමුත් ඔහුට තෑගි බෝග ලබා දී පිටත් කර යවා, ඔහු බොරු කීමට පරවියන් හේතු වූ බැවින් එම පරවියන් මරා දමන ලෙස උපදෙස් දුන්හ.'

- වෙළද දැන්වීම් ලෙස ගෙතූ ව්‍යාජ හදීස්
  වෙළද දැන්වීම් ලෙස ගෙතූ ව්‍යාජ හදීස්
  - 'යමෙක් වම්බටු අනුභව කරයිද, ඔහු ස්වර්ගයට ඇතුල් වනු ඇත.' (ව්‍යාජ හදීස් )

***(හේතු තුනක් උදාහරණ සමග පැහැදිලි කර ඇත්නම් ලකුණු 3×2=06 ක් ලබා දෙන්න.)***

(iv) ඉජ්මාඋ නීති මූලාශ්‍රයක් යන්න අල්කුර්ආන් සහ සුන්නා සාක්ෂි සහිතව ඔප්පු කරන්න. (ලකුණු 08යි)

- අල්කුර්ආන්, අස්සුන්නාහ්වලට පසුව ඉස්ලාමීය ඉතිහාසය තුළ ඉජ්තිහාද් පදනමින් බිහිවූ ඉතා වැදගත් සහය මූලාශ්‍රයක් ලෙස 'ඉජ්මා' දැක්විය හැකිය.
- 'ඉජ්මා' අනුමත කරන ලද්දක් යන්නට, අල්කුර්ආනයේ හා අස්සුන්නාහ්වේ සාධක ඇත.

**අල්කුර්ආනයේ 'ඉජ්මා' මූලාශ්‍රයක් යන්න සාධක**

- 'තවද (යුධ) සාමය හෝ නීතිය පිළිබද කිසියම් ප්‍රවෘත්තියක් ඔවුන්ට ලැබුණි නම්, (වහාම) ඔවුන් එය (පිටත ජනයා අතර) පතුරුවා හරිති. (එසේ නොකර) එය (අල්ලාහ්ගේ) දූතයාට ද ඔවුන් අතුරින් (ආගමික දැනුමැති) බලය ඇති අය වෙත ද දන්වා සිටියේ නම්, ඔවුන්ගෙන් එය සොයා බලා ගන්නා අය එය (හොඳින්) දැන ගනිති. තවද (විශ්වාසවන්තයිනි!) අල්ලාහ්ගේ ඉමහත් දායාදය හා ඔහුගේ ආනුභාවය ඔබ කෙරෙහි නොතිබුණා නම්, (ඔබ අතුරෙන්) සුළු සංඛ්‍යාවක් හැර අන් සෑම ෂෛයිතාන්වරයෙක් ම පිළිපදිනු ඇත.' (අල්කුර්ආන් 4:83)
- 'විශ්වාසවන්තයෙනි! අල්ලාහ්ට යටහත්වන්න. තවද (අල්ලාහ්ගේ) දූතයාට ද නුඹලා අතරින් (යහපත්) බලයලත් නායකයින්ට ද යටහත්වන්න.' (අල්කුර්ආන් 4:59)
- 'තවද යහමග මෙය යැයි තමන්ට පැහැදිලි වූ පසුව, කවුරුන් (අපගේ) මෙම දූතයානන්ට විරුද්ධ වී, විශ්වාසවන්තයන්ගේ මග නොවන (වෙනත් මගක්) පිළිදින්නේ ද ඔහුව අපි ඔහු හැරුණු (වැරදි) මගෙහි ම හරවා අරින්නෙමු. (පසු) ඔහුව නිරයට යවන්නෙමු. එහි ලැගුම්ගන්නා ස්ථානය ඉතා නපුරුය.' (අල්කුර්ආන් 4:115)
- 'ජනයා මත සාක්ෂි දරන්නන් ලෙස, ඔබව අපි මධ්‍යස්ථ සමාජයක් ලෙස තැනුවෙමු.' (අල්කුර්ආන් 2:143)

**අස්සුන්නාහ්වේ 'ඉජ්මා' මූලාශ්‍රයක් යන්න සාධක**

- 'මාගේ සමූහයා වැරදි සහගත කරුණුවල දී එකතු නොවෙති.' (ඉබ්නු මාජා)
- 'සත්‍යයෙහි ස්ථිර වූ පිරිසක් සැමදා මාගේ සමූහයේ සිටිති.' (අබූ දාවූද්)
- 'කවරෙක් නායකත්වයට කීකරු නොවී ඉවත් වී ගොස්, ජමාඅතයෙන් වෙන් වී මරණයට පත්වේද, ඔහුගේ මරණය (ජාහිලියියතය) අඥාණයට අයත් වූවකි.' (මුස්ලිම්)
- 'මුස්ලිම්වරුන් යහපත් යැයි සළකන දෑ අල්ලාහ් වෙත යහපතක් ම වේ. එලෙසම, ඔවුහු අයහපත ලෙස සළකන දෑ අල්ලාහ් වෙත අයහපත් දෙයක් ම වේ.' (අහ්මද්)
- 'කවරෙක් ස්වර්ගයේ සුවය විඳීම ප්‍රිය කරයි ද ඔහු සමාජයත් සමග එක්ව සිටිත්වා.'

***(මෙවැනි කරුණු දෙකක් අල්කුර්ආන් හා අස්සුන්නාහ් සාධක සඳහන් කරමින් පැහැදිලි කර ඇත්නම් ලකුණු 2×4=08ක් ලබා දෙන්න.)***

## ප්‍රශ්න අංක 03

**3.** (i) ආහාර ගැනීම පිළිබඳ ඉස්ලාමීය අරමුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02යි)

- මිනිසා අල්ලාහ්ගේ නියෝජිතයා වශයෙන් ජීවත් වීමට.
- අල්ලාහ් විසින් අනිවාර්ය කරනු ලැබූ කාර්යයන් ඉෂ්ට සිද්ධ කිරීමට.
- මිනිසා යහපත් ශරීර සෞඛ්‍යයකින් යුක්ත වීමට.
- තම වගකීම් උද්යෝගයෙන් ඉටුකිරීමට.
- විරුද්ධවාදීන්ගෙන් ඉස්ලාම් හා මුස්ලිම්වරු ආරක්ෂා කර ගැනීමට.

***(මෙවැනි කරුණු දෙකක් සඳහන් කර ඇත්නම් ලකුණු 1×2=2ක් ලබා දෙන්න.)***

(ii) ඇඳුම් ඇඳීම පිළිබඳ ඉස්ලාමීය අරමුණු ලියා, එයට අදාළ හදීස් මූලාශ්‍රයක් සඳහන් කරන්න. (ලකුණු 04යි)

- ඉස්ලාම් ඇඳුම් පැළඳුම් ඇඳීමට අරමුණු දෙකක් පෙන්වා දී ඇත.
  - ශරීරයේ ගෞරවය සුරැකීම.
  - බාහිර ස්වරූපය අලංකාර කිරීම.

- "සහාබිවරයෙක් 'අපගෙන් කෙනෙක් තනිව සිටිය ද අවුරතය ආවරණය කරගත යුතුද? යැයි විමසූ විට නබි (සල්) තුමාණෝ 'ඔබ ලැජ්ජාශීලීවන්නට අල්ලාහ් වඩාත් සුදුසුය.' යැයි පිළිතුරු දුන්හ." (අහ්මද්, තිර්මිදී, අබූ දාවූද්)

- "බාල ගනයේ වස්ත්‍රයකින් සැරසී පැමිණි පුද්ගලයෙකු බලා නබි (සල්) තුමාණෝ 'ඔබට ධනය ඇත්දැ'යි විමසුහ. එයට ඔහු 'ඔව්' යැයි පිළිතුරු දුන්නේය. කුමනාකාරයේ සම්පත්ද? යැයි විමසූ විට, 'සෑම ආකාරයෙන්ම සම්පත් අල්ලාහ් මට පිරිනමා ඇතැයි' පැවසුවේය. එවිට නබි (සල්) තුමාණෝ 'ඔබට අල්ලාහ් ධනය ලබා දුන්නේ නම්, ඔහු නුඹව ගරුත්වයට පාත්‍ර කොට ඔබ කෙරෙහි දැක්වූ දායාදයන්හි ලක්ෂණයන් නුඹගෙන් ඉස්මතු වීම ඔහු දැකීමට ඉඩ හරින්න' යැයි පැවසුහ." (නසාර්)

***(අරමුණුවලට ලකුණු 02ක් ද හදීස් මූලාශ්‍රයට ලකුණු 02ක් ද වශයෙන් ලකුණු 04 ක් ලබා දෙන්න.)***

(iii) ආහාර ලෙස ගැනීම තහනම් කරන ලද මාංශ පිළිබඳ ඉස්ලාමීක මඟ පෙන්වීම් ලියා දක්වන්න. (ලකුණු 06යි)

- මාංශ ලෙස තහනම් කරන ලද දෑ
  - මියගිය සතුන් ද රුධිරය ද සූකර (ඌරු) මාංශ
  - අල්ලාහ් නොවන දැහි නාමයෙන් කපන ලද දෑ
  - ගෙළ මිරිකා මරණ ලද දෑ
  - පහර දී මරණ ලද දෑ
  - උස් ස්ථානයකින් වැටී මරණයට පත් දෑ ද
  - වෙනත් සතෙකු විසින් ඇන මරණයට පත් දෑ
  - මාංශ භක්ෂිකයෙකු විසින් (ගොදුරු කොට) සපා කනු ලැබූ දෑ ද
  - අනුභව කිරීමට තහනම් කරන ලද සතුන්ගේ හා පක්ෂීන්ගේ මාංශ

- නබි (සල්) තුමාණෝ 'සත්ත්වයින්ගෙන් මුවහත් දත්වලින් යුක්ත සත්ත්වයින් ද පක්ෂීන්ගෙන් මුවහත් නියවලින්යුත් පක්ෂීන් ද අනුභව නොකරන' මෙන් පැවසුහ. (බුහාරි)
  - උදාහරණ: සිංහයා, කොටියා, නරියා, රාජඅලියා, උකුස්සා, යනාදි සතුන්ගේ මාංශ අනුභව කිරීමත් ඒවායේ නැග සවාරියැම ද නබි (සල්) තුමාණෝ වැළැක්වූහ.

***(මෙවැනි කරුණු හයක් සඳහන් කර ඇත්නම් ලකුණු 1×6=06ක් ලබා දෙන්න.)***

(iv) ඉස්ලාම් දෘෂ්ටිකෝණයෙන් විවාහයෙහි අරමුණු **හතරක්** සඳහන් කොට විස්තර කරන්න. (ලකුණු 08යි)

- ස්ත්‍රීන් හා පුරුෂයින් තම පතිවත හා විනය ආරක්ෂා කර ගැනීම.
  - ඉස්ලාමය දුරාචාරය හා සමලිංගික සේවනය වැනි අයුතු සම්බන්ධකමවලින් මිදී සිටීම අනිවාර්ය කරන අතර තම ලිංගික ආශාව ඉටුකර ගැනීමටත් පතිවත සුරකීමටත් ශිෂ්ට සම්පන්න ජීවිතයක් ගත කිරීමටත් විවාහය රුකුලක් වේ.

- ශිෂ්ට සම්පන්න මතු පරම්පරාව බිහි කිරීමේ අඩිතාලමකි.
  - මානව සමූහයේ පැවැත්මටත් ජීවිතය හැඩගස්වා ගැනීමටත් ඉවහල් වන්නේය.

- අඹු සැමියන් අතර ආදරය, සෙනෙහස, පරස්පර උදවු උපකාර කිරීම යනාදිය දිරි ගන්වයි.
  - අල්කුර්ආනයෙහි අඹු සැමියන් අතර පවතින සම්බන්ධය ශරීරයට හා වස්ත්‍රයට උපමා කොට තිබීමෙන් ඔවුන් දෙදෙනා අතර තිබිය යුතු අන්‍යෝන්‍ය සම්බන්ධයේ වැදගත්කම අවබෝධ කර ගත හැකි ය.

- පවුල් හා සමාජයේ සුබ සාධනය වෙනුවෙන් කටයුතු කිරීම.
  - විවාහය මගින් අඹු සැමියන් අතර වගකීම් පැවරීම මගින් නිරවුල් යහපත් පවුල් හා සමාජයක් බිහි වීමට මග සලසයි.

- මානව සාරධර්ම පරම්පරාගත කිරීමට ඉවහල් වේ.
  - විවාහයන් මගින් බිහිවන මෙවැනි පරම්පරාවන් මිනිස් සංහතියේ ශක්තිමත් පැවැත්මක් තහවුරු කරයි.

***(මෙවැනි කරුණු හතරක් සඳහන් කර පැහැදිලි කර ඇත්නම් ලකුණු 4×2 =08ක් ලබා දෙන්න.)***

## II කොටස

## ප්‍රශ්න අංක 04

4. (i) සමාජ අභිවෘද්ධියට මස්ජිද් ඉටු කළ යුතු කාර්යභාරය හඳුන්වාදී විස්තර කරන්න. (ලකුණු 10යි)

- මස්ජිදය වටා සමාජය ගොඩනැගිය යුතුය. අධ්‍යාත්මික, අධ්‍යාපනය, ආර්ථිකය, සෞඛ්‍ය, සංස්කෘතිය, සදාචාරය ආදී ක්ෂේත්‍රවල ප්‍රජා සාමාජිකයින් දැනුවත් කළ යුතුය.
- සමාජ ප්‍රගමනය සඳහා මස්ජිදුන් නබවි ඉටු කළ කාර්යභාරය අද මුස්ලිම් පල්ලිවල ඉටු කළ යුතුය. එම කාර්යභාරයන්:
  - ප්‍රජා කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.
  - අධ්‍යාත්මික පුහුණුව ලබා දීම.
  - වෙනත් ආගමිකයින් සමඟ සාකච්ඡා කරන ස්ථානයක් වීම.
  - සමාජ ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීම .
  - අධ්‍යාපන ආයතනයක් ලෙස කටයුතු කිරීම.
  - ප්‍රජාවගේ ආර්ථික අවශ්‍යතා සපුරාලන ස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.
  - කියවීම සඳහා පුස්තකාලයක් පිහිටුවීම.

- සමාජ සහජීවනය සහ ආගමික සහ වාර්ගික සහජීවනය ප්‍රවර්ධනය කිරීමේ ක්‍රම කෙරෙහි අවධානය යොමු කිරීම.
- තොරතුරු රැස් කිරීම සහ ඇගයීම් කාර්යයන් කෙරෙහි අවධානය යොමු කිරීම.
- තරුණයින්ට මගපෙන්වීම.
- අනාගත පෞරුෂය ගොඩනැගීම.

අද මුස්ලිම් මස්ජිද් මෙවැනි කාර්යයන් ඉටු කළ යුතුය.

***(මෙවැනි කරුණු පහක් පැහැදිලි කළහොත් 5 x 2 = ලකුණු 10 යි)***

(ii) මතුලොව ජීවිතය අවශ්‍යය යන්නට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

- මනුෂ්‍ය බලාපොරොත්තු ඉටුකර ගැනීමට මතුලොව අවශ්‍ය වේ.
- ලෝක ක්‍රියාවන් සම්පූර්ණ බලපෑම ලබා නොදේ. යහපත කරන අයට සම්පූර්ණ විපාකයක් හෝ හානියක් කරන්නන්ට සම්පූර්ණ දඬුවමක් හෝ ලබාදීමට නොහැක.
- මිනිසාගේ සියලු ආශාවන්, සිහින හා අපේක්ෂාවන් මෙලොවදී ඉටු නොවේ. ඒවා ඉටු කිරීමට තවත් එක් ලෝකයක් අවශ්‍යයි.
- මිනිසාට අවශ්‍ය වන්නේ මිය යාමට නොව දිගටම ජීවත් වීමටය. නමුත් ලෝකයේ නියදි සදාකාලික ජීවිතයක් නැත. නිත්‍ය ලෝකයක අවශ්‍යතාවය සිත පිළිගනී.
- මිනිස් ක්‍රියාවන් සඳහා දඬුවම් හෝ ත්‍යාග සඳහා සුදුසු - දිගු කාලීන වසමක් අවශ්‍ය වේ. එයට මතුලොව අවශ්‍ය වේ.
- මිනිසා අනෙකුත් නිර්මාණවලින් වෙන්කර උසස් නිර්මාණයක් ලෙස නිර්මාණය කර ඔහුට ලෞකික වස්තූන් ලබා දී මේවා ද මිය ගොස් අනෙකුත් නිර්මාණ මෙන් දූවිල්ලෙන් දූවිල්ලට පත්වීම කිසිසේත්ම අසාධාරණයකි.
- දෙවියන්වව ලෝකයේ දැකිය නොහැක. පරලොවදී දෙවියන් දැකීමට අවස්ථාවක් ඇත.

***(මෙවැනි කරුණු පහක් පැහැදිලි කළහොත් 5 x 2 = ලකුණු 10 යි)***

## ප්‍රශ්න අංක 05

5. (i) කියන ආකාරය සහ අවස්ථාව පදනම්කරගෙන වර්ගකරනු ලබන තලාක් **දෙවර්ගය** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

තලාක් පවසන ආකාරය අනුව වර්ග දෙකකට බෙදා ඇත.

**1. විධිමත් තලාක් (තලාක් අස්සුන්නි) :**

- ඉස්ලාමය විසින් නියම කර ඇති සීමාවන් තුළ තලාක් පැවසීම ගැන සඳහන් කරයි.
- විධිමත් තලාක් සඳහා වූ කොන්දේසි:
  - තලාක් කීම කාන්තාව පිරිසිදුව සිටින කාල පරිච්ඡේදයේදී (දුහර්) ය.
  - කාන්තාව පිරිසිදුව සිටියදී ලිංගිකව එක් නොවී තලාක් කීම.
  - දික්කසාදය සඳහා ලබා දී ඇති අවස්ථා තුනේම වෙන වෙනම පළමු, දෙවන සහ තෙවන පිරිසිදු කාල පරිච්ඡේදවල තලාක් පැවසීම. පළමු හා දෙවන අවස්ථාවල සීමාවුවත් එය නීත්‍යානුකූල වේ.

### 2. අවිධිමත් තලාක් (තලාක් අල්බිදඊ)

- තලාක් සඳහා ඉස්ලාම් විසින් නියම කර ඇති කොන්දේසි නිරීක්ෂණය නොකර තලාක් ප්‍රකාශ කිරීම ගැන සඳහන් කරයි. මේ නුසුදුසු තලාක් සඳහා වූ උදාහරණ.
  - කාන්තාවගේ අපිරිසිදු කාලය තුළ තලාක් කීම
  - ස්ත්‍රිය පිරිසිදුව සිටින විට ලිංගිකව එකතු වී සිටින අවස්ථාවේ තලාක් පැවසීම.
  - දික්කසාදය සඳහා ලබා දී ඇති අවස්ථා 3ම එකවර භාවිතා කරමින් තලාක් ප්‍රකාශ කිරීම.

තලාක් පවසනු ලබන අවස්ථාව අනුව වර්ග දෙකකට බෙදා ඇත.

### 1. තලාක් රජඊ (නැවත හිමිකර ගත හැකි):

- තලාක් රජඊ යනු නැවත හිමිකර ගතහැකි තලාක් යන්නයි. විධිමත් තලාකය දී පළමු හෝ දෙවන වතාවට තලාක් කියනු ලැබ ඉද්දා කාලය අවසන් වීමට පෙර යුවල නැවත එකට ජීවත් වීමට අයිතියක් ඇත. මෙවැනි එක්වීමට කොන්දේසි නොමැත.
- අල් කුර්ආන් නිදසුන් (2 : 229 - 228)

### 2. තලාක් බාඉන් ( නැවත හිමිකර ගත නොහැකි):

- තලාක් බාඉන් යනු නැවත හිමිකර ගත නොහැකි දික්කසාදයකි. එය වර්ග 2 කි.

### 1. බාඉන් සුග්රා ( සුළු වෙන්වීම)

- බාඉන් සුග්රා යන්නෙන් අදහස් කරන්නේ විධිමත් තලාක් වකවානුවකදී තුන්වන තලාක් ප්‍රකාශ කිරීමකින් තොරව මෙම කාලසීමාව සම්පූර්ණ කළහොත් නව නිකාහ් ගිවිසුමක් සමඟින් යුවළට නැවත එකට ජීවත් වීමට අවස්ථාව ලැබෙන අවස්ථාවයි.

  මෙහිදී යුවළට එකට ජීවත් වීමට කැමති නම්, නව නිකාහ් ගිවිසුමක් හරහා ඔවුන්ට එකට ජීවත් විය හැකිය.

### 2. තලාක් බායිගේ කුබ්රා (මහ වෙන්වීම)

- තලාක් බාඉන් කුබ්රා යන්නෙන් අදහස් කරන්නේ තලාක් 3ම කී අවසන් කර ඇති ප්‍රධාන වෙන්වීමකි.
- මෙයින් පසු ඔවුන් විවාහයෙන් එකට ජීවත් වීමට අවශ්‍ය නම් ඒ සඳහා අල් කුර්ආනයද මගපෙන්වීම ලබා දී ඇත. (බකරාඃ230)

***(තලාක් පවසන ක්‍රමය සඳහා ලකුණු 5 ක් සහ අවස්ථා සඳහා ලකුණු 5 ක් මුළු ලකුණු 5 x 5 = 10)***

(ii) ඉස්ලාමීය පෙන්වා දී ඇති පරිදි ළමයින් දෙමව්පියන්ට ඉටුකළ යුතු වගකීම් විස්තර කරන්න. (ලකුණු 10යි)

ඉස්ලාමයේ නියම කර ඇති පරිදි දරුවන්ගේ දෙමාපියන්ට දරුවන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් සඳහන් කරන්න.

දෙමාපියන් කෙරෙහි දරුවන්ගේ යුතුකම් දෙකට වර්ග කළ හැක.
1. දෙමාපියන් ජීවත්ව සිටියදී කළ යුතු දේ.
2. දෙමාපියන්ගේ මරණයෙන් පසු කළ යුතු දේ.

**දෙමාපියන් ජීවත්ව සිටියදී කළ යුතු දේ**

- ඇමතුමට පිළිතුරු දීම.
- ආදරයෙන් කරුණාවෙන් කටයුතු කිරීම.
- දෙමාපියන්ගේ කැපකිරීම් සඳහා කෘතඥතාවයෙන් යුතුව සැලකීම.
- අප්‍රසන්න වචන හෝ ක්‍රියාවෙන් වළකින්න.
- ආචාරශීලීව හැසිරීම.
- දෙමාපියන්ට කීකරු වීම.
- දෙමාපියන්ගේ අවශ්‍යතා සපුරාලීම.
- ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම.
- දෙමාපියන් අන් අයගේ විවේචනයට ලක් නොකිරීම.
- දෙමාපියන්ගේ රුචි අරුචිකම් දැනගෙන ඒ අනුව කටයුතු කරන්න.

**දෙමාපියන්ගේ මරණයෙන් පසු කළ යුතු දේ**

- ජනාසා රාජකාරිය ඉටු කිරීම.
- ඔවුන්ගේ ණය සම්පූර්ණ කිරීම.
- ඔවුන් වෙනුවෙන් සමාව ඉල්ලන්න.
- ඔවුන් විසින් කරන ලද ගිවිසුම් (මරණ කැමැත්ත, පොරොන්දු) ඉටු කිරීම
- තම ඥාතීන්ට ගරු කිරීම සහ ඔවුන්ට හැකිතාක් කරුණාව හා අවබෝධය දැක්වීම.
- තම මිතුරන්ට සහ හිතමිතුරන්ට ආචාරශීලීව සහ යහපත් හැසිරීම්වලින් සැලකීම.

***(මෙවැනි කරුණු පහක් පැහැදිලි කළහොත් 5 x 2 = ලකුණු 10 යි)***

## ප්‍රශ්න අංක 06

6. (i) ඉස්ලාම් නීති සම්පාදන ඉතිහාසයේ 'ඉජ්තිහාද්හි දොර වසා දමන ලදී' යන චින්තනයෙන් ඇති වූ ප්‍රතිවිපාක පරීක්ෂා කරන්න. (ලකුණු 10යි)

ඉස්ලාමීය නීති විද්‍යාවේ ඉතිහාසයේ 'ඉජ්තිහාද් දොරටුව වසා ඇත' යන අදහසේ ප්‍රතිවිපාක පරීක්ෂා කිරීම.

- මද්හබ් ඇල්ම වර්ධනය වීම.
- මද්හබ් අතර බොහෝ වාද විවාද ඇති විය.
- තක්ලීද් පොදු ගුණාංගයක් බවට පත් විය.
- කුර්ආනය හා හදීස් අධ්‍යයනය කිරීම වෙනුවට ඉමාම්වරුන්ගේ අදහස් අධ්‍යයනය කිරීමට උත්සාහ කිරීම.
- තේරුම් ගැනීමට අපහසු ප්‍රහේලිකා වැනි ග්‍රන්ථ බිහි වීම.

- විචාර බුද්ධියේ ඵලදායිතාව වටහා නොගැනීම.
- අල් කුර්ආනය සහ සුන්නාහ් සමඟ ඍජු සම්බන්ධතා නැතිවීම.

**(මෙවැනි අදහස් පහක් පැහැදිලි කර ලිව්වොත් ලකුණු 5 x 2 = 10)**

(ii) අල්කුර්ආන්හි භාෂාමය වශයෙන් හා විද්‍යාත්මක වශයෙන් ඇති ආශ්චර්යයන් ගැඹුරින් පරීක්ෂා කරන්න. (ලකුණු 10යි)

අල් කුර්ආනයේ භාෂාමය හා දාර්ශනික ආශ්චර්යයන් පිරික්සීමට.

- **භාෂාමය ආශ්චර්යය**
  - කාව්‍ය හා විවරණ වැනි සාහිත්‍ය ක්ෂේත්‍රවල දැනුම ලබා සිටි නිපුන විද්වතුන් අල්-කුර්ආනයේ ඉගැන්වීම් පිළිගැනීම ප්‍රතික්ෂේප කළ නමුත් එහි භාෂාමය විශිෂ්ටත්වය කෙරෙහි ආකර්ෂණය විය.
  - කාව්‍ය හා විවරණ විතරක් නොමැතිව සියලු ක්ෂේත්‍රවල සංකල්ප ඉදිරිපත් කිරීම එහි ශෛලිය සුවිශේෂයි.
  - අබූ ජහ්ල් අබූ සුෆ්යාන් වැනි සාහිත්‍ය ඍෂිවරුන් රහසිගතව අල් කුර්ආනය පාරායනය කිරීමෙන් සවන් දීමෙන් සතුටක් ලැබුවා.
  - සාහිත්‍යවේදියෙකු වූ වලීඩ් බින් මුකීරා අල්-කුර්ආනයට ඓතිහාසික ප්‍රශංසාවක් කළේය. "එයට රසයක් ඇත. අනිවාර්යෙන් එය පාරායනය කළ යුතුය. එහි මුදුන ඉදුණු හා ඵල සහිත ය. පතුල ගැඹුරට මුල් බැස ඇත. කිසිම දෙයකට එය ඉක්මවා යා නොහැක. "
  - ප්‍රසිද්ධ කවියෙකු වූ ලබීද්, සූරතුල් බකාරා සහ අලා ඉම්රාන් පාරායනය කිරීමෙන් පසු කවි රචනා කිරීම අත්හැරියේය.
  - සූරා නජ්ම් පාරායනයට සවන් දෙමින් සිටි කුරෙයිෂ්වරුන් සමහරෙක් නබිතුමා සමඟ සුජූද් වැඳ වැටුණි. (බුහාරි)

- **විද්‍යාත්මක ආශ්චර්යයක්**

මීට වසර සියයකට පෙර පවා සිතාගත නොහැකි සත්‍යයන් අල් කුර්ආනය මීට වසර 1400කට පෙර පවසා තිබූ බව අද විද්‍යා ලෝකය ඔප්පු කර හමාරය.

- උදාහරණයක් ලෙසඃ විශ්වයේ ආරම්භය සම්බන්ධයෙන් (නවීන විද්‍යාව එය මහා පිපිරුම් මූලධර්මය ලෙස හඳුන්වයි) -අන්බියා 30 වැනි පදය සඳහන් කරයි.
- (සූරතුල් හජ් - 5) වාක්‍යයේ දරුවෙකු නිර්මාණය කිරීම ගැන සඳහන් වේ.
- (සූරා රහ්මාන් 19 - 20) මුහුදු දෙකක් හමුවීම සහ ඒවා අතර බාධකයක් තිබීම ගැන සඳහන් කරයි.
- (සූරත් අල්-අන්ආම් - 125) ඔක්සිජන් ඝනත්වය ඉහළ යන විට අඩු වීම ගැන සඳහන් කරයි.
- (අල්-හිජ්ර්ඃ 22) පරාගනය සහ වැසි වලාකුළ ගැන සඳහන් කරයි.
- අද දක්වා විද්‍යා ලෝකයට නොතේරෙන විද්‍යාත්මක අදහස් (අර් රඅත්ඃ 2) අහස ඉහළට ඔසවා තැබීම පිළිබඳ අදහස

***(මෙවැනි අදහස් පහක් කොටස් දෙකම ආවරණය කරමින් පැහැදිලි කර ලියා ඇත්නම් ලකුණු 5x 2=10)***

## ප්‍රශ්න අංක 07

7. (i) අපරාධවලට විරුද්ධව ඉස්ලාම් පනවා ඇති දඬුවම්වල යුක්තිසහගත භාවය ඉදිරිපත් කරන්න. (ලකුණු 10යි)

1. ඉස්ලාමය කුමන අරමුණු පෙරදැරි කරගෙන දඬුවම් ක්‍රියාත්මක කරන්නේ ද එම අරමුණු ලබාගැනීමට තිබෙන නිසා එය සාධාරණයක් වන්නේය.
2. අපරාධ සිදුවීම වළක්වා ගත හැකි පරිසරයක් නිර්මාණය කිරීමෙන් පසුව ඉස්ලාමයේ දඬුවම් ක්‍රියාත්මක කරනු ලැබේ
උදාහරණයක් ලෙසඃ විවාහය හා බහු විවාහය දුරාචාරය වළක්වයි.
3. ඉස්ලාමය අපරාධ හා දඬුවම් ගැන පෙර සිටම පැහැදිලිව පවසා ඇත.
4. වඩාත් පැහැදිලිව, ජරාඉමුල් හුදූද්, ජරාඉමුල් කිසාස් වද්දියා, අල් කුර්ආනයෙහි සහ අල්-හදීසියේ දී පැහැදිලි කර ඇත.
5. ඉස්ලාමය මතුලොවේ දී ලැබෙන දඬුවම් අවධාරණය කර මිනිසාගේ මානසික පරිණතභාවය සපයයි. .
ඉස්ලාමය දඬුවම් නියම කිරීමට පෙර සමහර කොන්දේසි පනවයි.
    - අපරාධ සාක්ෂි සමඟ ස්ථාපනය කළ යුතුය
    - වැරදිකරු  වරද පිළිගත යුතුය.
    - අපරාධ කිරීමට බල නොකළ යුතුය.
    - අපරාධ සිදුකරන මානසිකත්වයෙන් විය යුතුය.
    - වරදකාරිත්වයට වැරදිකරු විය යුතුය.
    - දඬුවම් සාක්ෂි ඇතුව හා තාර්කික බවටත් විචාර බුද්ධියට සුදුසු ලෙස තිබීම හා තනි පුද්ගල කැමැත්ත පරිදි සිදුවිය නොහැක.
6. අපරාධ සිදු වූ අවස්ථාව අනුව ඉස්ලාමීය දඬුවම් ක්‍රියාත්මක වීම නිසා ඒවා සාධාරණ ක්‍රම වේ
7. ඉස්ලාම් අයුතු ලෙස දඬුවම් පමුණුවන්නේ නැත සැකය මත පදනම්ව දඬුවම් ලබා නොදන්න මෙම කියමන් උමර් (රලි) තුමාගේ කාලයේ සිදු වූ සිදුවීමක් ලෙස සම්මත කරයි . (හාතිබ් බින් අබි බල්තා සිදුවීම)
8. සමහර අපරාධයට සමාව ලබා දීමත් දඬුවම ලබන්නාගේ පවුලේ තත්ත්වය පිළිබඳව ඉස්ලාමය දක්වන සැලකිල්ලත් ඉස්ලාමීය දඬුවම් ක්‍රමය කෲර එකක් නොවේ යන්නට සාධකයකි.
9. පුද්ගල නිදහස සීමා සහිත විය යුතුය යන කාරණාවට ඉස්ලාමීය දඬුවම් ක්‍රමය උදව්වන බැවින් එය සාධාරණීය ක්‍රමයකි.
10. නබි (සල්) තුමාගේ කාලයේ හා කුලපාඋර් රාශිදූන්වරුන්ගේ කාලයේ දඬුවම් පමුණුවීම ඉතාමත් අඩුවෙන් පැවතුණි.

***(මෙවැනි අදහස් පහක් ලියා තිබේ නම්, 5 x 2 =10)***

(ii) මත්ද්‍රව්‍ය භාවිතය නිසා ඇතිවන සමාජ-ආර්ථික බලපෑම් සඳහන් කොට කරුණයින් අතර මත්ද්‍රව්‍ය භාවිතය නැවැත්වීමට ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න. (ලකුණු 10යි)

**සමාජ-ආර්ථිකමය බලපෑම්**

- ප්‍රජාවට ශක්තියක් එක් කරන යෞවනයන් දුර්වල වීමෙන් සමාජය දුර්වල වේ.
- විවාහ සබඳතාවලදී ගැටළු ඇති වේ
- දරුවන්ට බලපායි
- පාරම්පරාවට බලපායි.
- අධ්‍යාපන  ක්ෂේත්‍රය බලපෑමට ලක් වේ
- සදාචාරාත්මක බිඳවැටීමට තුඩු දේ.
- පවුල් ව්‍යුහය කඩාකප්පල් කරයි.
- සමාජ සමගිය කඩාකප්පල් කිරීම
- අපරාධ වැඩි වීම
- දුප්පත්කම

- කර්මාන්තය පිළිබඳ උනන්දුවක් නොමැතිවීම
- කර්මාන්තයේ අපේක්ෂිත ඉලක්කවලට ලඟා නොවීම

**යෞවනයන් අතර මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සඳහා උපදෙස්**

- මත්ද්‍රව්‍ය සහ එය භාවිතා කිරීමෙන් ඇතිවන බලපෑම් ගැන දෙමාපියන්ට දැනුවත් කිරීම.
- දෙමාපියන් සහ දරුවන් අතර සම්බන්ධතාවය ශක්තිමත් කිරීම.
- හොඳ මිතුරන් තෝරාගෙන ලබා දීම.
- නූතන යුගයේ දී භාවිතා කරන මත්ද්‍රව්‍ය ඉස්ලාමයේ තහනම් කර ඇති බව දරුවන්ට පැහැදිලි කිරීම.
- විවේක කාලය ඵලදායී ලෙස ගතකිරීම සඳහා ඉඩකඩ සකසා දීම.
- අල්ලාහ් සමඟ ඇති සම්බන්ධය ශක්තිමත් කිරීම සඳහා සලාතය සහ අල්-කුර්ආනය පාරායනය කිරීම වැනි අධ්‍යාත්මික කටයුතුවල යෙදීම.
- යෞවනයන් මුහුණ දෙන ගැටලුවලට විසඳුම් දීම සහ එය සමඟ පරලොව සම්බන්ධ වීම.
- මාර්ගෝපදේශ උපදෙස් ලබා දීම.
- අධ්‍යාත්මික සැසි වල තාරුණ්‍යය සම්බන්ධ කිරීම
- යෞවනයන් කේන්ද්‍රීය කරගත් ව්‍යාපෘත ක්‍රියාත්මක කිරීම.

උදාහරණයක් ලෙසඃ වෛද්‍ය කඳවුරු, පාසල් ළමුන් සඳහා ක්‍රීඩා තරඟ හා අධ්‍යාපනික කවයන්.

***(මෙවැනි සමාජ හා ආර්ථික බලපෑම් පහක් සහ යෝජනා පහක් ඉදිරිපත් කර ඇත්නම්, 5 x5 =10)***

## ප්‍රශ්න අංක 08

**8.** පහත සඳහන් මාතෘකා ගැන කෙටි සටහන් ලියන්න.

(i) අල්කුර්ආන් කොටසින් කොටස පහළ කිරීමට හේතු                                  (ලකුණු 05යි)

අල් කුර්ආන් කොටසින් කොටස පහළ කිරීමට හේතු

- නබිතුමාගේ සිත ශක්තිමත් කිරීම සඳහා පහළ වීම.
  - "(නබිවරයාණෙනි! තව්රාත්, ඉන්ජීල්, සබූර් වැනි ආගම් එකවර පහළවූවා මෙන්) 'අල්කුර්ආනය එකවර පහළ නොකරන ලද්දේ කුමන් හෙයින් ද?' යනුවෙන් විශ්වාස නොකරන්නන් ප්‍රශ්න කරති. මෙලෙස, (පහළ කරන ලද්දේ) නුඹගේ සිත එයින් ශක්තිමත් කරනු පිණිසය. අපි මනා පිළිවෙළින් එය පිළියෙළ කළෙමු. (අල්කුර්ආන් 25:32)
- ඒවා කටපාඩම් කර ආරක්ෂා කිරීමටත්, එහි පදනමින් ක්‍රියා කර මූලධර්මවලට ක්‍රියා ස්වරූපයක් ලබා දීම.
- සමාජ සංවර්ධනට අනුව පහළ කිරීම.
- නබිතුමාගෙන් අසන්නා වූ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමට.
- අල්කුර්ආනය පහසුවෙන් වටහා ගැනීමට.
- හෙළිදරව් කිරීම පහසු කරවීම සඳහා.
- ලිඛිතව තබා ආරක්ෂා කිරීමට අවස්ථාවක් ලබා දීමේ අරමුණින් පහළ කිරීම.
- සමාජ ප්‍රතිසංස්කරණ සඳහා පියවරෙන් පියවර ප්‍රවේශවීමට පහළ කිරීම.

***(මෙවැනි කරුණු පහක් පැහැදිලි කර ඇත්නම් ලකුණු 5×1=05ක් ලබා දෙන්න.)***

(ii) ඉස්ලාමීය කර්මාන්තවල වැදගත්කම (ලකුණු 05යි)

**ඉස්ලාමීය කර්මාන්තවල වැදගත්කම**

- ඉස්ලාමය අනුමත කරන ඉපැයීම් අතුරින් කර්මාන්ත ද එකකි.
- නබිවරු කර්මාන්තවල නිරත වී ඇත.
  - දාවුත් (අලෛ) තුමා ලෝහ භාවිත කිරීම. (අල්කුර්ආන් 34:10) (අල්කුර්ආන් 21:80)
  - නූහ් (අලෛ) තුමා නැවක් නිර්මාණය කිරීමේ නිපුණත්වය ලබා තිබීම.
  - සකරිය්යා (අලෛ) තුමා වඩු වැඩවල නියැළුණේය.
- කර්මාන්ත ඉගෙන ගැනීම සුන්නාහ් සහ ඉබාදා බවට පත් කර ඇත. "
- 'ඔබ දන්නා කර්මාන්තයක් ඉගැන්වීමෙන් ඔබව අපායෙන් ගලවා ගත හැකිය.' (අල්හදීස්)
- කර්මාන්තවල පදනම වන යකඩ පිළිබඳ ව අල්-කුර්ආනය සඳහන් කර ඇත. (අල්කුර්ආන් 57:25)
- අද දැවැන්ත කාර්මීකරණය යකඩ යකඩ මගින් සිදු කෙරේ.
- නබි (සල්) තුමාණන්ගේ කාලයේ සිටි සමහර සහාබිවරුන්ට ආයුධ හා ආභරණ කම්හල් තිබුණි.
- සහාබිවරුන්ද කර්මාන්තවල නියැළුණහ.
  - නබි (සල්) තුමාගේ භාර්යාවක් වූ සයිනබ් බින්ත් ජහ්ෂ් (රළි) තුමිය දැල් වියන ස්වයං රැකියාවක නියැළුණාය.

***(මෙවැනි කරුණු පහක් පැහැදිලි කර ඇත්නම් ලකුණු 5×1=05ක් ලබා දෙන්න.)***

(iii) ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වාදීම (ලකුණු 05යි)

**ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වාදීම**

ශ්‍රී ලංකාවට ඉස්ලාම් හඳුන්වා දුන් කාලය පිළිබඳව බොහෝ මතවාද තිබේ. එම අදහස් සහ ඒවායේ මූලාශ්‍ර අපට පහත සඳහන් වන පරිදි අවධානයට යොමු කළ හැකිය.

- නබි (සල්) තුමාගේ කාලයේ දී ශ්‍රී ලංකාවට ඉස්ලාම් ආගම හඳුන්වා දෙන ලදී:
  - නබි (සල්) තුමාගේ කාලයේ සහබි වහාබ් ඉබ්නු අබි හෆ්සා (රළි) තුමා මගින් ශ්‍රී ලංකාවට ඉස්ලාම් ආගම හඳුන්වාදීම.
- කලීෆා උමර් (රළි) තුමාගේ කාලයේදී ශ්‍රී ලංකාවට ඉස්ලාම් ආගම හඳුන්වා දෙන ලදී:
  - ඉබ්නු ෂහ්රයාන් තුමාගේ සාක්ෂි : තෙවන අග්‍රබෝධි රජතුමා, නබි තුමා පිළිබඳ තොරතුරු ලබා ගැනීමට දූතයෙකු යැවීමේ සිදුවීම.
- උමෙයියා පාලන කාලයේ දී ශ්‍රී ලංකාවට ඉස්ලාම් ආගම හඳුන්වා දෙන ලදී:
  - 'ජේම්ස් ටෙනන්ට්' තුමාගේ අදහසට අනුව, උමෙයියා පාලන කාලයේ දී බනූ හාෂිම්වරුන්ගේ ආගමනයත් සමඟ ඉස්ලාම් හඳුන්වා දෙන ලදී. මේ සඳහා සාක්ෂි දෙකක් ඉදිරිපත් කෙරේ.
  - ඉතිහාසඥ අල් බලාදුරි තුමාගේ අදහසට අනුව, 8වන සියවස ආරම්භයේ දී ශ්‍රී ලංකාවේ රජ කළ මානවම්ම රජු (ක්‍රි.ව.684-719) විසින් ශ්‍රී ලංකාවේ මරණයට පත්වූ අරාබි ජාතිකයින් සමහර වැන්දඹුවන් හා ගැහැණු දරුවන් අරාබිකරයට යවනු ලැබීය.

***(මෙවැනි කරුණු පහක් පැහැදිලි කර ඇත්නම් ලකුණු 5×1=05ක් ලබා දෙන්න.)***

(iv) හජ්හි ලෞකික ප්‍රයෝජන (ලකුණු 05යි)

**හජ්හි ලෞකික ප්‍රයෝජන**

- හජ් උත්සවය මගින් ලෝක මුස්ලිම් උම්මාවට අයත් යන හැඟීම ඇති කරයි.
- සහෝදරත්වය වර්ධනය කරයි.
- මුස්ලිම්වරුන්ගේ පුද්ගලිත්වය එළි දක්වයි.
- සහජීවනය හා මානසික පරිණතභාවය පුහුණු කරයි.
- සංචාර අත්දැකීම් හා ජීවිතයේ දුෂ්කරතා විඳ දරාගැනීමට මානසික ශක්තියක් ලබා දෙයි.
- මනුෂ්‍යත්වය පෝෂණය කරයි.
- ජාත්‍යන්තර සාමයට උර දෙයි.
- හජ්, මුස්ලිම් ප්‍රජාවගේ ජාත්‍යන්තර සම්මේලනයකි.
- අන්‍යෝන්‍ය කැපවීම් සමග ජීවත් වීමට පුහුණු කරයි.

***(මෙවැනි කරුණු පහක් පැහැදිලි කර ඇත්නම් ලකුණු 5×1=05ක් ලබා දෙන්න.)***

********